# අල්ලස් පනත

(2005 දෙසැම්බර් 01 වැනි දින දක්වා සංශෝධන එකතු කිරීම)

# 26 වන අධිකාරය

## අල්ලස්

අල්ලස් වැළැක්වීම සහ අල්ලස් සම්බන්ධයෙන් දඬුවම් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසද වෙනත් ලිඛිත නීති ක්‍රියාවේ යෙදවීමට සම්බන්ධ ආනුෂංගික විධි විධාන සැලැස්වීම පිණිසද වූ පනතකි.

1954 අංක 11
1956 අංක 17
1958 අංක 40
1965 අංක 2
1965 අංක 18
දරන පනත්
ජාතික රාජ්‍ය
සභාවේ
1973 අංක 8
1974 අංක 38
1976 අංක 11
දරන පනත්
1980 අංක 9
1994 අංක 20
දරන පනත

(1954 මාර්තු මස 1 වන දින.)

1. මෙම පනත අල්ලස් පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

2. (1) 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජ සභා ආඥාවේ[@] සඳහන් කිසිවක් හා ගැටිය හැකි හෝ අනුකූල නොවිය හැකි මෙම පනතේ සෑම විධිවිධානයක් ම ඒ රාජ සභා ආඥාවේ 29 වන වගන්තියේ (4) වන උප වගන්තියෙහි වූ අතුරු උපවගන්තියෙන් පනවා ඇති නියමය ඉෂ්ඨ කිරීමෙන් පසු ව පාර්ලිමේන්තුව විසින් පනවනු ලැබූ, එකී රාජ සභා ආඥාව සංශෝධනය කිරීමේ පනතක තිබූ විධිවිධානයක් ලෙස සියලු ම කාර්යයන් සඳහා සෑම අතින් ම වලංගු හා බල සහිත විය යුතු ය.

වෙනත් ලිඛිත නීති ක්‍රියාවේ යෙදවීම කෙරෙහි මෙ පනතේ බල පෑම

(2) මෙම පනතේ විධිවිධාන වෙනත් යම් ලිඛිත නීතියක් හා ගැටෙන හෝ අනුකූල නොවන අවස්ථාවක මෙම පනත ඒ වෙනත් ලිඛිත නීතිය අභිභවා පැවතිය යුතු ය.

### 1 වන කොටස

### අල්ලස් චෝදනා පරීක්ෂා කිරීම සහ අල්ලස් පිළිබඳ ව නඩු පැවරීම

(1958අංක40

2.(අ) ඉවත් කරන ලදි. (1994අංක20

3. ඉවත් කරන ලදි. (1994අංක20

4. ඉවත් කරන ලදි. (1994අංක20

5.ඉවත් කරන ලදි. (1994අංක20

---

[@] 1972 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ඉවත් කරන ලද අතර එම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවද 1978 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ඉවත් කරන ලදි.

CM 008227—1000 (2007/12)

අපරාධ නඩු විධාන සංග්‍රහය පනත අදාළ වීම.
(1980අංක9§ 4)

6. (1) (2) වන උප වගන්තිය මගින් අත් හරිනු ලැබ නොමැති නම් මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධාන, මේ පනත යටතේ වූ වැරදි සඳහා අධිකරණයක පවරනු ලබන නඩු කටයුතු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(2) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 306 වන වගන්තිය, මේ පනත යටතේ, මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු කටයුතු සඳහා අදාළ නොවිය යුතු ය.

1994අංක20§2

7. ඉවත් කරන ලදි.

23අ වන වගන්තිය යටතේ වරදක් සම්බන්ධයෙන් අල්ලස් සඳහා වූ අධිචෝදනාවක් විභාග කිරීමට අධිකරණ බලය.
(1980 අංක 9 §6)

8. වෙනත් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, මේ පනතේ 23අ වන වගන්තිය යටතේ වරදක් සම්බන්ධයෙන් අල්ලස් සඳහා වූ අධිචෝදනාවක් විභාග කිරීමේ අධිකරණ බලය, ඕනෑම අධිකරණ කලාපයක පැවැත්වෙන මහාධිකරණයට තිබිය යුතු ය.

(1980 අංක 9 §7)

9. ඉවත් කරන ලදි.

(1994 අංක20 §2)

10. ඉවත් කරන ලදි.

අධිචෝදනා පත්‍රයෙහි නිශ්චිතව නොසඳහන් සාක්ෂිකරුවන් කැඳවීම සහ ලේඛන පාවිච්චි කිරීම හා ඉදිරිපත් කිරීම
(1965 අංක 2 §8)
(1980 අංක 9 §9)

11. මේ පනත යටතේ වරදක් සඳහා වූ නඩු විභාගයේ දී, වෙන යම් ලිඛිත නීතියක පටහැනි ව කුමක් සඳහන් ව ඇතද එය නොතකා, සාක්ෂිකරුවන්ගේ නැතහොත් ඉදිරිපත් කිරීම්වල නාම ලේඛනයෙහි නිශ්චිත ව නොසඳහන් යම් සාක්ෂිකරුවකු කැඳවීම හෝ එසේ නො සඳහන් යම් ලේඛනයක් පාවිච්චි කිරීම හෝ ඉදිරිපත් කිරීම අධිකරණය හෝ චෝදක විසින් කළ හැකිය.

අධිකරණයෙහි අල්ලස් සම්බන්ධ නඩු කටයුතුවල දී යම් තැනැත්තකු වෙත නිකුත් කෙරෙන සිතාසි බාර දිය යුතු ආකාරය
(1965 අංක 2 §8)
(1980 අංක 9§10)

12. සාක්ෂිකරුවන් වෙත සිතාසි භාර දීම සම්බන්ධයෙන් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත මගින් නියමිත ආකාරයට අතිරේක ව, අධිකරණයක පැවැත්වෙන අල්ලස් පිළිබඳ නඩුකතාව වලදී යම් තැනැත්තකු වෙත නිකුත් කෙරෙන සිතාසි පහත සඳහන් ආකාරයෙන් භාර දිය හැකි ය.

(අ) කැඳවිය යුතු තැනැත්තා වෙත ඔහුගේ ලිපිනය ලියූ ලියාපදිංචි කළ ලිපියක් සීඝ්‍රගාමී තැපැලෙන් යැවීමෙන් ; හෝ

(ආ) රජයේ සේවකයකු වූ විටෙක එකී රජයේ සේවකයා සේවය කරන දෙපාර්තමේන්තුවේ, කාර්යාලයේ හෝ ආයතනයේ ප්‍රධානයා වෙත ඒ රජයේ සේවකයාගේ ලිපිනය ලියූ ලියාපදිංචි කළ ලිපියක් ශීඝ්‍රගාමී තැපැලෙන් යැවීමෙන් ; හෝ

(ඇ) වෙන යම් තැනැත්තකු යටතේ සේවය කරන යම් තැනැත්තකු වූ විටෙක, සේවා යෝජක වෙත ඔහුගේ ලිපිනය ලියූ ලියාපදිංචි කළ ලිපියක් සීඝ්‍රගාමී තැපැලෙන් යැවීමෙන් ; හෝ

(ඈ) යම් ග්‍රාම නිලධාරියෙකුගේ මාර්ගයෙන් ; හෝ

(ඉ) හදිසි අවස්ථාවලදී විදුලි පණිවිඩයක මාර්ගයෙන්

(1958අංක40§ 12)

13. ඉවත් කරන ලදි.

## 11 වන කොටස

## අල්ලස් පිළිබඳ වැරදි

14. (අ) අධිකරණ නිලධරයකුට නැතහොත් පාර්ලිමේන්තු මන්ත්‍රී වරයකුට, ඒ නිලධරයා විසින් තම අධිකරණ තත්ත්වය අනුව වූ නැතහොත් ඒ මන්ත්‍රීවරයා විසින් එබඳු මන්ත්‍රීවරයකුගේ තත්ත්වය අනුව වූ යම් ක්‍රියාවක් කිරීම හෝ කිරීමෙන් වැළකී සිටීම සඳහා පෙළඹවීමක් හෝ ත්‍යාගයක් වශයෙන් යම් තුටු පඩුරක් පිරිනමන, හෝ | අධිකරණ නිලධ හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සම්බන්ධයෙන් දු අල්ලස්

(ආ) අධිකරණ නිලධරයකු ව නැතහොත් පාර්ලිමේන්තු මන්ත්‍රී වරයකු ව, තම අධිකරණ තත්ත්වය අනුව වූ නැතහොත් එබඳු මන්ත්‍රී වරයකුගේ තත්ත්වය අනුව වූ යම් ක්‍රියාවක් කිරීම හෝ කිරීමෙන් වැළකී සිටීම සඳහා පෙළඹවීමක් හෝ ත්‍යාගයක් වශයෙන් යම් තුටු පඩුරක් අයැදින හෝ භාර ගන්නා

තැනැත්තකු අවුරුදු හතක් නොඉක්මවන කාලයක බරපතල වැඩ ඇති බන්ධනාගාරගත කිරීමකින් සහ රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකින් දඬුවම් කළ හැකි වරදකට වරදකරු විය යුතු ය : (1965 අංක 2 §

එසේ වුව ද, යම් වෘත්තීය සංගමයක් හෝ වෙනත් සංවිධානයක් විසින් යම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වෙත ඔහුගේ තඩත්තුවේ කාර්යයන් සඳහා පමණක් වූ යම් දීමනාවක් හෝ වෙනත් ගෙවීමක් පිරිනැමීම හෝ එබඳු යම් මන්ත්‍රීවරයකු විසින් යම් වෘත්තීය සංගමයකින් හෝ වෙනත් සංවිධානයකින් එබඳු දීමනාවක් හෝ වෙනත් ගෙවීමක් භාර ගැනීම , මේ වගන්තියේ පෙරාතුව වූ විධිවිධාන යටතේ වරදක් නොවිය යුතු ය. (1956 අංක 17

15. (අ) යම් තැනැත්තකු වෙනුවෙන් තමා රජයේ සේවකයකු හා සම්මුඛ සාකච්ඡා කිරීම සඳහා හෝ | රජයේ සේවකය සම්මුඛ සාකච්ජ කිරීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් වි තුටු පඩුරු භාර ගැනීම

(ආ) අධිකරණ හෝ අර්ධ අධිකරණ කාර්යයන් ක්‍රියාවෙහි යොදවන රජයේ සේවකයකු ඉදිරිපිට යම් තැනැත්තකු වෙනුවෙන් තමා පෙනී සිටීම සඳහා

පෙළඹවීමක් හෝ ත්‍යාගයක් වශයෙන් යම් තුටු පඩුරක් අයැදින හෝ භාර ගන්නා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු අවුරුදු හතක් නොඉක්මවන කාලයක බරපතල වැඩ ඇති බන්ධනාගාරගත කිරීමකින් සහ රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකින් දඬුවම් කළ හැකි වරදකට වරදකරු විය යුතු ය .

එසේ වුව ද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු අධිකරණයක් ඉදිරිපිට හෝ රජයේ සේවකයෙක් සාමාජිකයෙකු නොවන ව්‍යවස්ථාපිත විනිශ්චය අධිකාරයක් ඉදිරිපිට නීතිඥවරයකු වශයෙන් පෙනී සිටීම මෙම වගන්තියේ පෙරාතුව වූ විධිවිධාන යටතේ වරදක් නොවිය යුතු ය.

(1965 අංක 2 §

16 (අ) වැරැදකරුවන්ට තඩු පැවරීම, ඔවුන් සොයා ගැනීම හෝ ඔවුන්ට දඬුවම් දීම පිණිස යම් තත්ත්වයකින් සේවයෙහි යොදවා සිටින යම් පොලිස් නිලධරයකු, සාම නිලධරයකු හෝ වෙනත් රජයේ සේවකයකු නැතහොත් අධිකරණයක නිලධරයකු විසින්, යථා පරිදි වූ යුක්තිය පසිඳලීමකට බාධා කිරීම හෝ යම් වරදක් කරවීම හෝ කිරීමට පහසුකම් ලබාදීම හෝ යම් වරදක් කරන්නා සොයා ගනු ලැබීමෙන් හෝ දඬුවම් කරනු ලැබීමෙන් ආරක්ෂා කිරීම හෝ තම බලතල යම් තැනැත්තකුට හානිකර ව නැතහොත් පීඩාදායක ව අයුතු ලෙස යෙදීම සඳහා පෙළඹවීමක් හෝ ත්‍යාගයක් වශයෙන් ඒ නිලධරයාට හෝ සේවකයාට යම් තුටු පඩුරක් පිරිනමන, හෝ | පොලිස් නිලධර සාම නිලධරයන වෙනත් රජයේ සේවකයන් සම්බන්ධයෙන් අල්ලස්

(ආ) එබඳු නිලධරයකු ව හෝ සේවකයකු ව, මෙම වගන්තියේ (අ) ඡේදයේ සඳහන් බාධා කිරීමකට, වරද කරවීමකට, පහසුකම් ලබා දීමකට, ආරක්ෂා කිරීමකට හෝ අයුතු ලෙස යෙදීමකට පෙළඹවීමක් හෝ ත්‍යාගයක් වශයෙන් යම් තුටු පඩුරක් අයදින හෝ භාරගන්නා

1965 අංක 2 § 9) තැනැත්තකු අවුරුදු හතක් නොඉක්මවන කාලයක බරපතල වැඩ ඇති බන්ධනාගාරගත කිරීමකිත් සහ රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකින් දඬුවම් කළ හැකි වරදකට වරදකරු විය යුතු ය.

17. (අ) යම් වැඩක් ඉටු කිරීම, යම් සේවයක් සැපයීම, යම් දෙයක් කිරීම හෝ යම් භාණ්ඩයක්, උපකරණයක් හෝ ද්‍රව්‍යයක් සැපයීම පිණිස රජය සමග කර ගනු ලබන යම් ගිවිසුමක් ලබාදීම, අනුග්‍රහණය කිරීමේ දී හෝ එබඳු යම් ගිවිසුමක් ලියා අත්සන් කිරීමේ දී හෝ එහි ගිවිසි මිල හෝ ප්‍රතිජ්ඨාව නැතහොත් ඒ සම්බන්ධයෙන් ගෙවිය යුතු යම් සහන මුදලක් ගෙවීමේ දී රජයේ සේවකයකුගේ සහාය වීම හෝ බල පෑම සඳහා පෙළඹවීමක් හෝ ත්‍යාගයක් වශයෙන් ඒ රජයේ සේවකයාට යම් තුටු පඩුරක් පිරිනමන, හෝ

(ආ) රජයේ සේවකයකු ව, මෙම වගන්තියේ (අ) ඡේදයෙහි සඳහන් යම් ගිවිසුමක් ලබා දීම අනුග්‍රහණය කිරීමේ දී හෝ එබඳු ගිවිසුමක් ලියා අත්සන් කිරීමේ දී හෝ එහි ගිවිසි මිල හෝ ප්‍රතිජ්ඨාව නැතහොත් ඒ සම්බන්ධයෙන් ගෙවිය යුතු යම් සහන මුදලක් ගෙවීමේ දී සහාය වීම හෝ බල පෑම සඳහා පෙළඹවීමක් හෝ ත්‍යාගයක් වශයෙන් යම් තුටු පඩුරක් අයදින හෝ භාර ගන්නා

1965 අංක 2 § 9) තැනැත්තකුට අවුරුදු හතක් නොඉක්මවන කාලයක බරපතල වැඩ ඇති බන්ධනාගාරගත කිරීමකිත් සහ රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකින් දඬුවම් කළ හැකි වරදකට වරදකරු විය යුතු ය.

ටෙන්ඩර් පත්‍ර ස්කරවා ගැනීම ණිස වූ ල්ලස්

18. (අ) යම් වැඩක් ඉටු කිරීම, යම් සේවයක් සැපයීම, යම් දෙයක් කිරීම, හෝ යම් භාණ්ඩයක්, උපකරණයක් හෝ ද්‍රව්‍යයක් සැපයීම පිණිස රජයෙන් ගිවිසුමක් ලබා ගැනීමේ චේතනාවෙන්, ඒ ගිවිසුමට ටෙන්ඩර් පත්‍රයක් ඉදිරිපත් කළ තැනැත්තකු විසින් එකී ටෙන්ඩර් පත්‍රය අස් කර ගැනීම සඳහා පෙළඹවීමක් හෝ ත්‍යාගයක් වශයෙන් ඒ තැනැත්තාට යම් තුටු පඩුරක් පිරිනමන හෝ :

(ආ) ඒ ගිවිසුම සඳහා තමා විසින් ඉදිරිපත් කරනු ලැබූ ටෙන්ඩර් පත්‍රයක් අස් කර ගැනීම සඳහා පෙළඹවීමක් හෝ ත්‍යාගයක් වශයෙන් යම් තුටු පඩුරක් අයදින හෝ භාර ගන්නා

1965 අංක 2 § 9) තැනැත්තකු අවුරුදු හතක් නොඉක්මවන කාලයක බරපතල වැඩ ඇති බන්ධනාගාරගත කිරීමකිත් සහ රුපියල් පන්දහයක් නොඉක්මවන දඩයකින් දඬුවම් කළ හැකි වරදකට වරදකරු විය යුතු ය.

ණ්ඩුවේ කටයුතු ම්බන්ධයෙන් වූ ල්ලස්

19. (අ) රජයේ සේවකයකු විසින් යම් නිල කාර්යයක් ඉටු කිරීම හෝ ඉටු කිරීමෙන් වැළකී සිටීම සඳහා හෝ එකී රජයේ සේවකයා විසින් හෝ වෙනයම් රජයේ සේවකයකු විසින් යම් නිල කාර්යයක් ඉක්මන් කිරීම, ප්‍රමාද කිරීම, එයට බාධා කිරීම නැතහොත් එය වැළැක්වීම සඳහා හෝ රජය සමග යම් කටයුත්තක් කිරීමේ දී යම් කතැනැත්තකුට ආධාර කිරීම, පක්ෂග්‍රාහී වීම, බාධා කිරීම හෝ ප්‍රමාද කිරීම සඳහා පෙළඹවීමක් හෝ ත්‍යාගයක් වශයෙන් යම් තුටු පඩුරක් ඒ රජයේ සේවකයාට පිරිනමන, හෝ

(ආ) රජයේ සේවකයකු ව, යම් නිල ක්‍රියාවක් ඉටු කිරීම හෝ ඉටු කිරීමෙන් වැළකී සිටීම සඳහා හෝ මෙම වගන්තියේ (අ) ඡේදයෙහි සඳහන් ඉක්මන් කිරීමක්, ප්‍රමාද කිරීමක්, බාධා කිරීමක්, වැළැක්වීමක්, ආධාර කිරීමක් හෝ පක්ෂග්‍රාහී වීමක් සඳහා පෙළඹවීමක් හෝ ත්‍යාගයක් වශයෙන් යම් තුටු පඩුරක් අයදින හෝ භාර ගන්නා හෝ

(ඇ) රජයේ සේවකයකු ව යම් තුටු පඩුරක් අයදින හෝ භාර ගත්තා ;

තැනැත්තකු අවුරුදු හතක් නොඉක්මවන කාලයක බරපතල වැඩ ඇති බන්ධනාගාරගත කිරීමකින් සහ රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකින් දඬුවම් කළ හැකි වරදකට වරදකරු විය යුතු ය. (1974 අංක 38 §

(1965 අංක 2 § 

එසේ වුවද, නීතිය හෝ තම රක්ෂාවේ කොන්දේසි අනුව ලබා ගැනීමට තමාට බලය පැවරී ඇති යම් තුටු පඩුරක් රජයේ සේවකයකු විසින් අයැදීම හෝ භාර ගැනීම වරදක් නො වන්නේ ය.

(ජා.රා.1974 අංක

එසේ ම තව දුරටත , රජයේ සේවකයකු වන වෛද්‍ය වෘත්තිකයකුට කිසියම් තුටු පඩුරක් අයැදීමට හෝ භාර ගැනීමට වෛද්‍ය ආඥාපනතේ 35 වන වගන්තියෙන් හිමිකම නොතිබිය යුතු ය. (1980 අංක 9 § 

20. (අ) i. යම් ඉල්ලීමක සම්පූර්ණ ගෙවීම හෝ කොටසක් ආණ්ඩුවෙන් ලබාදීම, හෝ

ii. තමා හෝ වෙන යම් තැනැත්තකු යම් ධුරයකට පත් කරවා දීම නැතහොත් පත් කරවා දීමට ආධාර කිරීම හෝ

iii. යම් ධුරයකට වෙන යම් තැනැත්තකු පත් කරනු ලැබීම වැළැක්වීම, හෝ

iv. ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක. කාර්යාලයක හෝ ආයතනයක යම් රක්ෂාවක් තමාට හෝ වෙන යම් තැනැත්තකුට ලබා දීම හෝ ලබා ගැනීමට ආධාර කිරීම, හෝ

v. ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක. කාර්යාලයක හෝ ආයතනයක යම් සේවයක් වෙන යම් තැනැත්තකු විසින් ලබා ගැනීමෙන් වැළැක්වීම, හෝ

vi. ආණ්ඩුවෙන් දෙනු ලබන යම් ප්‍රදානයක්, බද්දක් හෝ වෙනත් ප්‍රතිලාභයක් තමාට හෝ වෙනත් තැනැත්තකුට ලබා දීම හෝ ලබා ගැනීමට ආධාර කිරීම, හෝ

vii. එබඳු යම් ප්‍රදානයක්, බද්දක් හෝ ප්‍රතිලාභයක් වෙන යම් තැනැත්තකු විසින් ලබා ගැනීම වැළැක්වීම සඳහා පෙළඹවීමක් හෝ ත්‍යාගයක් වශයෙන් යම් තුටු පඩුරක් යම් තැනැත්තකුට පිරිනමන, හෝ

ඉල්ලීම, ගෙවීම, පත් කිරීම, සේවයෙහි යෙදවීම ප්‍රදාන, බදුදීම් සහ වෙනත් ප්‍රතිලාභ සම්බන්ධයෙන් වූ අල්ලස්

(ආ) මෙම වගන්තියේ (අ) ඡේදයේ (i), (ii), (iii), (iv), (v), (vi) , (vii) යන අනුඡේදයන්හි නිශ්චිත ව සඳහන් ක්‍රියාවන්ගෙන් කිසිවක් කිරීම සඳහා පෙළඹවීමක් හෝ ත්‍යාගයක් වශයෙන් යම් තුටු පඩුරක් අයදින හෝ භාර ගන්නා

තැනැත්තකු අවුරුදු හතකට වැඩි නොවන කාලයක බරපතල වැඩ ඇති බන්ධනාගාරගත කිරීමකින් සහ රුපියල් පන් දහසක් නොඉක්මවන දඩයකින් දඬුවම් කළ හැකි වරදකට වරදකරු විය යුතු ය. (1965 අංක 2 § 

ආණ්ඩුව සමග ගනු දෙනු ඇති තැනැත්තන් විසින් රජයේ සේවකයන්ට දෙන අල්ලස්

21. (අ) ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක්, කාර්යාලයක් හෝ ආයතනයක් මගින් ආණ්ඩුව සමග යම් අන්දමක ගනු දෙනු ඇතිව සිටිය දී, ඒ දෙපාර්තමේන්තුවේ, කාර්යාලයේ හෝ ආයතනයේ සේවයෙහි යෙදී සිටින යම් රජයේ සේවකයකුට යම් තුටු පඩුරක් පිරිනමන, හෝ

(ආ) ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක්, කාර්යාලයක් හෝ ආයතනයක් මගින් ආණ්ඩුව සමග යම් අන්දමක ගනු දෙනුවක් ඇති ව සිටීමට පෙර අවුරුද්දක් ඇතුළත හෝ ඇති ව සිටීමෙන් පසු අවුරුද්දක් ඇතුළත ඒ දෙපාර්තමේන්තුවෙ, කාර්යාලයේ හෝ ආයතනයේ සේවයෙහි යෙදී සිටින යම් රජයේ සේවකයකුට යම් තුටු පඩුරක් පිරිනමන, හෝ

(ඇ) රජයේ සේවකයකු ව, මේ වගන්තිය යටතේ පිරිනැමීම වරදක් වන යම් තුටු පඩුරක් අයදින හෝ භාර ගන්නා

(1965 අංක 2 § 9)

තැනැත්තකු අවුරුදු හතකට වැඩි නොවන කාලයක බරපතල වැඩ ඇති බන්ධනාගාරගත කිරීමකින් සහ රුපියල් පන් දහසක් නොඉක්මවන දඩයකින් දඬුවම් කළ හැකි වරදකට වරදකරු විය යුතු ය ;

එසේ වුව ද, මෙම වගන්තියේ (ආ) ඡේදයෙහි සඳහන් ගනුදෙනුවකට සම්බන්ධ හෝ අදාළ නොවූ කාර්යයක් සඳහා සද්භාවයෙන් යුක්ත ව තුටු පඩුර පිරිනමන ලද්දේ යැයි ද තමා විසින් තුටු පඩුර පිරිනැමූ වේලෙහි එබඳු යම් ගනුදෙනුවක් පිළිබඳ බලාපොරොත්තුවක් හෝ අපේක්ෂාවක් තමා තුළ නොතිබුණ බව හෝ ඒ තුටු පඩුර ඒ රජයේ සේවකයා විසින් එබඳු යම් ගනුදෙනුවකට සම්බන්ධ හෝ අදාළ යම් ක්‍රියාවක් කිරීම හෝ කිරීමෙන් වැළකී සිටීම සඳහා පෙළඹවීමක් හෝ ත්‍යාගයක් විය යුතු යැයි තමා අදහස් නො කළ බව ද පිරිනමන්නා විසින් ඔප්පු කරනු ලැබුවහොත්, ඒ ඡේදයේ සඳහන් තුටු පඩුරක් රජයේ සේවකයකු වෙත පිරිනැමීම මෙම වගන්තිය යටතේ වරදක් නොවිය යුතුය.

පළාත් පාලන ආයතනයක හෝ උපලේඛනගත ආයතනයක හෝ උපලේඛනගත ආයතනයක පාලක මණ්ඩලයේ සාමාජිකයකු සඳහා වූ අල්ලස් සහ පළාත් පාලන ආයතනයක හෝ එබඳු ආයතනයක නිලධාරියකු හෝ සේවකයකු සඳහා වූ අල්ලස්

22. (අ) පළාත් පාලන ආයතනයක හෝ උපලේඛනගත ආයතනයක හෝ උපලේඛනගත ආයතනයක පාලක මණ්ඩලයේ සාමාජිකයකුට -

(i) ඒ පළාත් පාලන ආයතනය, උපලේඛනගත ආයතනය හෝ එහි පාලක මණ්ඩලය හෝ කාරක සභාව වෙත ඉදිරිපත් කරනු ලැබූ ක්‍රියා පිළිවෙළකට, යෝජනාවකට හෝ ප්‍රශ්නයකට එකී පළාත් පාලන ආයතනයේ, උප ලේඛනගත ආයතනයේ, පාලක මණ්ඩලයේ හෝ කාරක සභාවේ යම් රැස්වීමක දී එකී සාමාජිකයා විසින් පක්ෂ ව හෝ විපක්ෂ ව ඡන්දය දීම හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීම සඳහා, හෝ

(ii) ඒ සාමාජිකයා විසින් යම් නිල කාර්යයක් ඉටු කිරීම හෝ ඉටු කිරීමෙන් වැළකී සිටීම හෝ ඉටු කිරීම සිදු කරලීමට, ඉක්මන් කිරීමට, ප්‍රමාද කිරීමට, එයට බාධා කිරීමට හෝ එය වැළැක්වීමට ආධාර කිරීම සඳහා, හෝ

(iii) යම් වැය ශීර්ෂයක් සම්මත කිරීම හෝ යම් ගිවිසුමක් හෝ ඵලයක් යම් තැනැත්තකුගේ වාසියට ප්‍රදානය කිරීම ඉටු කරලීමට හෝ වැළැක්වීමට එකී සාමාජිකයා විසින් ආධාර කිරීම සඳහා පෙළඹවීමක් හෝ ත්‍යාගයක් වශයෙන් යම් තුටු පඩුරක් පිරිනමන, හෝ

(ආ) යම් පලාත් පාලන ආයතනයක හෝ යම් උපලේඛනගත ආයතනයක නිලධරයකුට හෝ සේවකයකුට -

(i) ඒ නිලධරයා හෝ සේවකයා විසින් යම් නිල කාර්යයක් ඉටු කිරීම හෝ ඉටු කිරීමෙන් වැළකී සිටීම හෝ ඉටු කිරීම සිදු කරලීමට, ඉක්මන් කිරීමට, ප්‍රමාද කිරීමට, එයට බාධා කිරීමට හෝ එය වැළැක්වීමට ආධාර කිරීම සඳහා, හෝ

(ii) යම් වැය ශීර්ෂයක් සම්මත කිරීම හෝ යම් ගිවිසුමක් හෝ ළඟයක් යම් තැනැත්තකුගේ වාසියට ප්‍රදානය කිරීම එකී නිලධරයා හෝ සේවකයා විසින් ඉටු කරලීම හෝ වැළැක්වීම සඳහා පෙළඹවීමක් හෝ ත්‍යාගයක් වශයෙන් යම් තුටු පඬුරක් පිරිනමන, හෝ

(ඇ) මෙම වගන්තියේ (අ) ඡේදයෙහි සඳහන් සාමාජිකයකු ව, ඒ ඡේදයේ ( i ) වන (ii) සහ (iii) වන අනුඡේදවල සඳහන් යම් ක්‍රියාවක් කිරීමට හෝ කිරීමෙන් වැළකී සිටීමට පෙළඹවීමක් හෝ ත්‍යාගයක් වශයෙන් යම් තුටු පඬුරක් අයදින හෝ භාර ගන්නා, හෝ

(ඈ) මෙම වගන්තියේ (ආ) ඡේදයෙහි සඳහන් නිලධරයකු හෝ සේවකයකු ව, ඒ ඡේදයේ (i) වන සහ (ii) වන අනුඡේදවල සඳහන් යම් ක්‍රියාවක් කිරීමට හෝ කිරීමෙන් වැළකී සිටීමට පෙළඹවීමක් හෝ ත්‍යාගයක් වශයෙන් යම් තුටු පඬුරක් අයදින හෝ භාර ගන්නා (1965 අංක 2 §

තැනැත්තකු අවුරුදු හතක් නොඉක්මවන කාලයක බරපතල වැඩ ඇති බන්ධනාගාරගත කිරීමකින් සහ රුපියල් පන් දහසක් නොඉක්මවන දඩයකින් දඬුවම් කළ හැකි වරදකට වරදකරු විය යුතු ය.

23. (අ) යම් පලාත් පාලන ආයතනයක හෝ උපලේඛනගත ආයතනයක හෝ උපලේඛනගත ආයතනයක පාලක මණ්ඩලයේ සාමාජිකයකු විසින්, එහි යම් රැස්වීමකට ඉදිරිපත් කරනු ලබන යම් ක්‍රියා පිළිවෙළකට, යෝජනාවකට, තීරණයකට හෝ ප්‍රශ්නයකට පක්ෂ ව හෝ විපක්ෂ ව තම ඡන්දය දීමට හෝ නො දී සිටීමට හෝ ඒ පලාත් පාලන ආයතනයේ, උපලේඛනගත ආයතනයේ හෝ පාලක මණ්ඩලයේ හෝ එහි කාරක සභාවේ රැස්වීමකට පැමිණ නොසිටීමට ඒ සාමාජිකයාට යම් තර්ජනයකින්, කපටිකමකින්, සත්‍යය සඟවන් කිරීමකින් හෝ වෙනත් නීති විරෝධී ක්‍රමයකින් බල පෑමට තැත් කරන, හෝ

පලාත් පාලන ආයතනයක හෝ උපලේඛනගත ආයතනයක හෝ උපලේඛනගත ආයතනයක පාලක මණ්ඩලයේ සාමාජිකයකුගේ ඡන්දය කෙරෙහි බල පෑම පිණිස තර්ජනය කිරීම හෝ වංචා කිරීම

(ආ) යම් වැය ශීර්ෂයක සම්මත කිරීම හෝ යම් ගිවිසුමක් හෝ ළඟයක් යම් තැනැත්තකු ගේ වාසියට ප්‍රදානය කිරීම, ඉටු කරලීමට හෝ වැළැක්වීමට නැතහොත් යම් නිල ක්‍රියාවක් ඉටු කිරීම හෝ ඉටු කිරීමෙන් වැළකී සිටීම හෝ ඉටු කිරීම සිදු කරලීමට, ඉක්මන් කිරීමට, ප්‍රමාද කිරීමට, එයට බාධා කිරීමට හෝ එය වැළැක්වීමට ආධාර කිරීම සඳහා පලාත් පාලන ආයතනයක හෝ උපලේඛනගත ආයතනයක හෝ උපලේඛනගත ආයතනයක පාලක මණ්ඩලයේ යම් සාමාජිකයකුට හෝ නිලධරයකුට හෝ සේවකයකුට, පෙරාතුව වූ ඡේදයෙහි සඳහන් යම් ක්‍රමයකින් බල පෑමට තැත් කරන

තැනැත්තකු අවුරුදු හතක් නොඉක්මවන කාලයක බරපතල වැඩ ඇති බන්ධනාගාරගත කිරීමකින් සහ රුපියල් පන් දහසක් නොඉක්මවන දඩයකින් දඬුවම් කළ හැකි වරදකට වරදකරු විය යුතු ය. (1965 අංක 2 §

අල්ලස්වලින් අත්කරගත් දේපළ හෝ අල්ලස්වලින් අත්කරගත් දේපලින් පරිවර්තනය කර ඇති හෝ කර තිබූ දේපළ ලෙස මෙම වගන්තිය යටතේ සැලකෙන දේපළ අයත් ව සිටීම හෝ අයත් ව සිටි බව වරදක් විය යුතු බව.
(1958 අංක40 §14)

23 (අ) (1) 1954 මාර්තු මස 1 වන දින හෝ ඉන් පසුව තැනැත්තකු විසින් යම් දේපලක් අත්කරගෙන තිබෙන හෝ අත්කර ගෙන තුබූ අවස්ථාවක දී, ඒ දේපල -

(අ) මුදලින් තිබෙන විට -

(i) ඔහුගේ දැනගත් ආදායමේ හෝ ලැබීම්වල කොටසක්, හෝ

(ii) ඔහුගේ දැනගත් ලැබීම්වල යම් කොටසකින් පරිවර්තනය කර ඇති හෝ කර තුබූ මුදල් නොවිය හැකි හෝ නොවිය හැකි ව තුබූ විටෙක, හෝ

(ආ) මුදල් නොවන දේපලවලින් තිබෙන විට

(i) ඔහුගේ දැනගත් ආදායමේ යම් කොටසකින් අත්කරගත් දේපළ හෝ

(ii) ඔහුගේ දැනගත් ලැබීම්වල කොටසක් වන හෝ වී තුබූ දේපළ හෝ ඔහුගේ දැනගත් ලැබීම්වල යම් කොටසකින් පරිවර්තනය කර ඇති හෝ කර තිබූ දේපළ නොවිය හැකි හෝ නොවිය හැකි ව තිබූ විටෙක;

මෙ වගන්තිය යටතේ වූ යම් නඩු පැවරීමක කාර්යයන් සඳහා ඒ දේපල ඔහු විසින් අල්ලස්වලින් අත්කරගත් හෝ අල්ලස් වලින් ඔහු විසින් අත්කරගත් යම් දේපලකින් ඔහු විසින් පරිවර්තනය කර ඇති හෝ කර තිබූ දේපල වී තිබෙන හෝ තුබූ ලෙස, ඊට පටහැනි ව කරුණු ඔප්පු කරනු ලබන තෙක්, සලකනු ලැබිය යුතු ය.

(2) (1) උප වගන්තියෙහි "ආදායම" යන්නට අල්ලස්වලින් ලැබූ ආදායම ඇතුලත් නොවන අතර එහි "ලැබීම්" යන්නට අල්ලස්වලින් ලැබූ ලැබීම් ඇතුලත් නො වේ.

(3) අල්ලස්වලින් තමා විසින් අත්කරගෙන තිබෙන හෝ අත්කරගෙන තුබූ හෝ අල්ලස්වලින් තමා විසින් අත්කරගත් යම් දේපලකින් තමා විසින් පරිවර්තනය කර ඇති හෝ කර තුබූ දේපල ලෙස (1) වන උප වගන්තිය යටතේ සලකනු ලබන යම් දේපලක අයිතිකරු ව සිටින හෝ සිටි තැනැත්තකු අවුරුදු හතක් නොඉක්මවන කාලයක බරපතල වැඩ ඇති බන්ධනාගාරගත කිරීමකින් සහ රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකින් දඬුවම් කල හැකි වරදකට වරුදකරු විය යුතු ය.

1965 අංක2 §10)

එසේ වුවද, ඒ දේපල යම් බැංකුවක ඒ තැනැත්තාගේ ගිණුමේ බැරට තැන්පත් කර ඇති දල් වී තිබෙන හෝ වී තුබූ අවස්ථාවක. ඔහුගේ අනුමැතිය හෝ දැනුම නොමැති ව වෙන යම් තැනැත්තකු විසින් ඒ තැන්පත් කිරීම කර තිබෙන බවට හෝ කර තිබූ බවට ඒ තැනැත්තා විසින් අධිකරණය සෑහීමට පත් කල අවස්ථාවක, ඔහු මෙම උප වගන්තියේ පෙරාතුව වූ විධිවිධාන යටතේ යම් වරදකට වරදකරු නොවී ය යුතුය.

(4) මෙම වගන්තිය යටතේ වූ වරදක් සඳහා යම් තැනැත්තකුට විරුද්ධ කිසි ම නඩු පැවරීමක්, ඒ වරද සඳහා ඔහුට විරුද්ධව නඩු නොපැවරීමට හේතු දැක්වීමේ අවස්ථාවක් කොමිෂන් සභාව විසින් ඒ තැනැත්තාට දී තිබේ නම් මිස සහ හේතු දැක්වීමට ඔහු අපොහොසත් වී නම් හෝ ඔහු විසින් දක්වන ලද හේතු ඒ කොමිසන් සභාවේ මතය අනුව අසතුටුදායක නම් මිස, ආරම්භ නොකල යුතු ය.

(1974 අංක 38 § 9)

(5) යම් තැනැත්තකුගේ භාර්යාව හෝ ස්වාමිපුරුෂයා හෝ වයස අවුරුදු දහඅටට අඩු අවිවාහක දරුවකු විසින් 1954 මාර්තු මස 1 වන දින හෝ ඉන්පසු යම් චංචල හෝ නිශ්චල දේපලක් අත්කර ගෙන ඇති අවස්ථාවක එම දේපල අත්කර ගන්නා ලද්දේ අවස්ථාවෝචිත පරිදි එම භාර්යාව හෝ ස්වාමි පුරුෂයා හෝ අවිවාහක දරුවා විසින් නොව ඒ තැනැත්තා විසින් යැයි ඊට පටහැනිව කරුනු ඔප්පු කරන තුරුල මේ වගන්තියේ කාර්යයන් සඳහා පූර්ව නිගමනය කල යුතු ය.

(6) මේ වගන්තිය යටතේ වරදක් සඳහා යම් නඩු පැවරීමක දී යම් නිශ්චල දේපලක වටිනාකම හෝ ඒ දේපල මත යම් ගොඩනැගිල්ලක් ඉදි කිරීමේ පිරිවැය සම්බන්ධයෙන් ප්‍රධාන තක්සේරුකරුගෙන් සහතිකයක්, ඊට පටහැනිව කරුනු ඔප්පු කරනු ලබන්නේ නම් මිස සහ එසේ කරනු ලබන තෙක්, ඒ වටිනාකම සහ ඉදි කිරීමේ පිරිවැය සම්බන්ධයෙන් ප්‍රමාණවත් සාක්ෂි විය යුතුය. (1980 අංක 9 § 1

මේ උප වගන්තියෙහි "ප්‍රධාන තක්සේරුකරු" යන්නෙන් ආණ්ඩුවේ ප්‍රධාන තක්සේරුකරු අදහස් වන අතර ඊට ආණ්ඩුවේ තක්සේරු දෙපාර්තමේන්තුවේ යම් ජ්‍යෙෂ්ඨ සහකාර තක්සේරුකරුවෙක් හෝ සහකාර තක්සේරුකරුවෙක් ඇතුලත් වේ.

(1980 අංක 9 § 1

(7) මේ වගන්තියෙහි කාර්යයන් සඳහා "තැනැත්තකු" යන්නෙන්, 18 වන වගන්තියෙහි හෝ 20 වන වගන්තියෙහි සඳහන් කිසියම් ක්‍රියාවකට එම තැනැත්තා ගේ සම්බන්ධතාවක් ඇතැයි දැක්විය හැකි වුවද, නොවුවද, මේ පනතේ අර්ථානුකූලව ඔහු රජයේ සේවකයකු වුවද නොවුවද, කවර වූ හෝ යම් තැනැත්තකු අදහස් වේ.

24. මේ පනතේ මෙම කොටසේ යම් වගන්තියක් යටතේ වූ යම් වරදක් සඳහා යම් තැනැත්තකුට විරුද්ධ නීති කෘත්‍යකදී, එකී වගන්තියේ සඳහන් යම් ක්‍රියාවක් ඔහු විසින් කිරීම හෝ කිරීමෙන් වැළකී සිටීම සඳහා ප්‍රතිඥාවක් වශයෙන් තුටු පඩුර පිරිනැමූ බව විශ්වාස කිරීමට හෝ සැක කිරීමට කරුනු ඇතිව තිබියදී ඔහු විසින් යම් තුටු පඩුරක් භාරගත් බව ඔප්පු වී තිබේ නම් එම ක්‍රියාව කිරීමට හෝ කිරීමෙන් වැළකී සිටීමට ඇත්ත වශයෙන්ම ඔහුට බලය, අයිතිවාසිකම හෝ අවස්ථාව නොතිබූ බව, නැතහොත් එසේ කිරීමට හෝ කිරීමෙන් වැළකී සිටීමට අදහස් නොකොට එකී තුටු පඩුර ඔහු විසින් භාරගත් බව, නැතහොත් ඇත්ත වශයෙන් ම ඔහු විසින් ඒ ක්‍රියාව නොකල බව හෝ කිරීමෙන් වැළකී නොසිටිය බව නොසලකා, ඔහු එකී වගන්තිය යටතේ වූ වරදකට වරදකරු විය යුතුය.

කාර්යය ඉෂ්ට නොකළද තුටු පඩුර භාර ගත්තා වරදකරු විය යුතු බව

25. (1) මේ පනතේ මෙම කොටස යටතේ වූ යම් වරදක් කිරීමට හෝ කරවීමට තැත් කරන සහ ඒ තැත් කිරීමේ දී ඒ වරද කිරීමට තුඩු දෙන යම් ක්‍රියාවක් කරන තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර. පලමු සඳහන් වරදට මෙම පනතින් නියමිත ආකාරයට ම නඩු විභාගයකට භාජන කරනු ලැබීමට හා වරදකරු කරනු ලැබීමේදී එම දඬුවමට ම යටත් විය යුතු ය.

මෙම කොටස යටතේ වූ වරදක් කිරීමට තැත් කිරීම හා අනුබල දීම.

(2) මේ පනතේ මෙම කොටස යටතේ වූ යම් වරදකට අනුබල දෙන තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර. පලමු සඳහන් වරදට මෙම පනතින් නියමිත ආකාරයට ම නඩු විභාගයකට භාජන කරනු ලැබීමට හා වරදකරු කරනු ලැබීමේදී එම දඬුවමට ම යටත් විය යුතු ය. මෙම උප වගන්තියෙහි " අනුබල දෙන " යන යෙදුමට දණ්ඩ නීති සංග්‍රහයේ 100 වන සහ 101 වන වගන්ති වල ඇති අර්ථයම තිබිය යුතු ය

(1974 අංක38§10)

(3) මේ පනතේ මෙම කොටස යටතේ යම් වරදක් කිරීමට වෙනත් තැනැත්තකු සමග කුමන්ත්‍රණය කරන යම් තැනැත්තකු වරදකරුවකු වන අතර, පළමු සඳහන් වරදට මෙම පනතින් නියමිත ආකාරයටම තඩු විභාගයකට භාජනය කරනු ලැබීමට හා වරදකරු කරනු ලැබුවිට පළමු සඳහන් වරදට මෙම පනතින් නියමිත දඬුවමටම යටත් විය යුතු ය. මෙම උපවගන්තියෙහි "කුමන්ත්‍රණය කිරීම" යන යෙදුමෙහි, දණ්ඩනීති සංග්‍රහයේ 113(අ) වන වගන්තියෙහි එම යෙදුමට දී ඇති අර්ථය ම ඇත්තේ ය.

වෙනත් දඬුවමකට අතිරේකව දණ්ඩන මුදලක් නියම කළ හැකි අවස්ථා (1965 අංක 2§ 11) (1980 අංක 9§13)

26. මේ පනතේ මෙම කොටසේ යම් විධිවිධානයක් උල්ලංඝනය කර යම් තුටු පඩුරක් භාර ගැනීමෙත් කළ වරදකට අධිකරණයක් විසින් යම් තැනැත්තකු වරදකරු කරනු ලැබූ අවස්ථාවක, ඒ තුටු පඩුර මුදලක් නම් නැතහොත් ඒ තුටු පඩුරෙහි වටිනාකම තක්සේරු කළ හැකි නම් අධිකරණය විසින් ඒ තැනැත්තාට පමුණුවනු ලබන වෙනත් යම් දඬුවමකට අතිරේක වශයෙන් ආඥාවෙහි නිශ්චිත ව සඳහන් කළ හැකි කාලයක් ඇතුළත ඒ තුටු පඩුරට සමාන වූ හෝ අධිකරණයේ මතය අනුව ඒ තුටුපඩුරේ වටිනාකම වූ මුදලක් දණ්ඩනයක් වශයෙන් ගෙවන ලෙස අධිකරණය විසින් ඔහුට නියම කළයුතු ය.

අතිරේක දඩයක් නියම කළ යුතු බව (1974 අංක 38§ 11) (1980 අංක 9§14)

26 අ. මහාධිකරණය විසින් යම් තැනැත්තකු 23 අ වන වගන්තිය යටතේ යම් වරදක් සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ අවස්ථාවක, මේ පනත යටතේ ඒ අධිකරණය විසින් නියම කළ යුතු යැයි නියමිත දණ්ඩනයකට අතිරේකව, අල්ලස් වලින් හෝ අල්ලස් වලින් ලත් දෙයකින් අත්කර ගත් ප්‍රමාණය නැතහොත් අල්ලස් වලින් හෝ අල්ලස් වලින් ලත් දෙයකින් දේපළ බවට පරිවර්තනය කරගෙන තිබෙන ප්‍රමාණය වශයෙන් එකී අධිකරණය විසින් තීරණය කරනු ලබන ප්‍රමාණයට අඩු නොවන්නා වූ ද එම ප්‍රමාණය මෙන් තුන් ගුණයකට වැඩි නොවන්නා වූ ද, දඩයක් එම අධිකරණය විසින් ඔහුට නියම කළ යුතු ය.

(1994 අංක20 4)

27. ඉවත් කරන ලදී.

අධිකරණයක් විසින් නියම කරනු ලැබූ දඩය හෝ දණ්ඩන මුදල අයකර ගැනීම (1965 අංක2§13) (1980 අංක9 §16)

28 (1) අල්ලස් පිළිබඳ ව අධිකරණයක් විසින් යම් තැනැත්තකුට නියම කරනු ලැබූ දඩයක් හෝ දණ්ඩන මුදලක්, ඒ දඩය හෝ දණ්ඩන මුදල නියම කිරීමේ ආඥාව රජයේ වාසියට හා ඒ තැනැත්තාට විරුද්ධ ව දිසා අධිකරණය විසින් කරනු ලැබූ තීන්දු ප්‍රකාශයක් මෙන් සලකනු ලැබ අයකර ගත හැකිය.

• (3) මෙම වගන්තියේ පෙරාතුව වූ විධිවිධානවල සඳහන් දඩය හෝ දණ්ඩන මුදල ගෙවීමට යටත් තැනැත්තා ඒ දඩය හෝ දණ්ඩන මුදල නියම කිරීමට හේතු වූ වරද කළ දිනයෙහි රජයේ සේවකයකු ව සිටි අවස්ථාවක, වෙනත් ලිඛිත නීතියක පටහැනි ව කුමක් සඳහන් වුව ද , එය නොතකා ඒ තැනැත්තාගේ චංචල හා නිශ්චල දේපළවලට අතිරේක ව ඒ තැනැත්තාගේ භාර්යාව, නොහොත් ස්වාමි පුරුෂයා විසින් හෝ ඒ තැනැත්තා විසින් නඩත්තු කරනු ලබන පුතකු හෝ දුවක විසින් ඒ දිනයට පසු අත්කරගත්තා ලද යම් චංචල හෝ නිශ්චල දේපළක් වෙතොත් එසේ අත්කර ගත් දේපළ-

---

• 1965 අංක 2 දරන පනත මගින් (2) වන සහ (4) වන උප වගන්ති ඉවත් කරන ලදී.

(අ) ඒ භාර්යාව නොහොත් ස්වාමි පුරුෂයා විසින් හෝ පුතා හෝ දුව විසින් මිලයට ගනු ලැබ් නම්, හෝ

(ආ) ඒ දඩය හෝ දණ්ඩන මුදල ගෙවීමට යටත් තැනැත්තා විසින් ඒ භාර්යාවගේ නොහොත් ස්වාමි පුරුෂයාගේ හෝ පුතාගේ හෝ දුවගේ නමින් මිලයට ගනු ලැබ් නම්,හෝ

(ඇ) ඒ දඩය හෝ දණ්ඩන මුදල ගෙවීමට යටත් වීමට හේතු වූයේ යම් තුටු පඩුරක් භාර ගැනීම ද, ඒ තුටු පඩුර පිරිනැමූ තැනැත්තා ගෙන් ඒ භාර්යාව නොහොත් ස්වාමි පුරුෂයා විසින් හෝ පුතා හෝ දුව විසින් මිලයට ගැනීමෙන් හෝ තෑග්ගක් වශයෙන් හෝ අන් ලෙසකින් අත්කර ගනු ලැබ් නම්, හෝ

(ඈ) ඒ දඩය හෝ දණ්ඩන මුදල ගෙවීමට යටත් තැනැත්තාගෙන් අන්තිම කැමති පත්‍රය සහිත හෝ රහිත උරුමයෙන් අත්කර ගනු ලැබ් නම්,

ඒ දඩය හෝ දණ්ඩන මුදල අය කර ගැනීම සඳහා තහනමට ගෙන විකිණීමට යටත් විය යුතු ය.

❖ 28අ. (1) මේ පනතේ වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් ව ඇත ද, අධිකරණයක් විසින් මේ පනතේ මේ කොටස යටතේ වූ වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු වරදකරු කරනු ලබන අවස්ථාවක, අධිකරණය විසින් 26 වන වගන්තිය හෝ 26අ වගන්තිය යටතේ දණ්ඩනයක් හෝ දඩයක් නියම කිරීම වෙනුවට, අල්ලසින් හෝ අල්ලසින් ලැබුන මුදල්වලින් අත්කරගෙන ඇතැයි තීරණය කෙරෙන චංචල හෝ නිශ්චල දේපල කිසිවක් සියලු බැඳීම්වලින් තොරව රාජ සන්තක කළ යුතු යයි ආඥා කළ හැකි ය.

වරදක් සිදු කිරීම හා සම්බන්ධ දේපළ රාජසන්තක කිරීම.

(1994 අංක 20

එසේ වුවද, රාජසන්තක කිරීමේ ආඥාවක් කළ යුතු දැයි තීරණය කිරීමේ දී, වටිනාකම සඳහා සද්භාවයෙන් මිලදී ගත් තැනැත්තකුගේ හෝ ඒ දේපල විෂයෙහි සද්භාවයෙන් සම්බන්ධතාවක් වටිනාකම සඳහා අත් කර ගෙන ඇති වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම් කෙරෙහි ඒ ආඥාව හානිකර වීමට ඉඩ තිබේ ද යන වග සැලකිල්ලට ගැනීමට, අධිකරණයට හිමිකම ඇත්තේ ය.

(2) (1) වන උප වගන්තිය යටතේ කරන ලද ආඥාවක් :

(අ) රාජසන්තක කිරීමේ ආඥාවට විරුද්ධ අභියාචනාධිකරණයට හෝ ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක, රාජසන්තක කිරීමේ ආඥාව ස්ථිර කරමින්, හෝ අනුමත කරමින් ඒ අභියාචනය තීරණය කරනු ලැබූ විටක,

(ආ)රාජසන්තක කිරීමේ ආඥාවට විරුද්ධව අභියාචනාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කර නොමැති අවස්ථාවක, අධිකරණයේ ඒ ආඥාවට විරුද්ධව අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි කාලය ඉකුත් වූ විට

බලාත්මක විය යුතු ය.

---

❖ 1994 අංක 25 දරණ අල්ලස් සංශෝධන පනතේ 18 වන වගන්තියට අනුව 28(අ) වගන්තිය එක් කිරීම මගින් මගින් ප්‍රධාන පධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධනය ප්‍රධාන ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයේදී බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සැලකිය යුතු අතර, ඒ අනුව පහි විස්තර කර ඇති දඬුවම, නියමිත දිනයට පෙර සිදු කරන ලද වරදක් සඳහා ද නියම කරනු ලැබිය හැකිය

අධිකරණයක් විසින් යම් තැනැත්තකු අල්ලස් පිළිබඳව වරද කරු කරනු ලැබීමේ හෝ පරීක්ෂණ කොමිෂන් සභාවක් විසින් තැනැත්තකු අල්ලස් පිළිබඳව වරද කරු බැව් තීරණය කරනු ලැබීමේ විපාක.

(1958 අංක 40 §18)
(1980 අංක 9 § 17)

29. අධිකරණයක් හෝ පරීක්ෂණ කොමිෂන් සභාවක් විසින් යම් තැනැත්තකු වරදකරු කරනු ලැබූ හෝ වරදකරු බැව් තීරණය කරනු ලැබූ අවස්ථාවක , ඒ වරදකරු කිරීමේ හෝ තීරණය කිරීමේ හේතුවෙන්

(අ) ඒ වරදකරු කිරීමේ හෝ තීරණයේ දින සිට අවුරුදු 7 ක කාලසීමාවක් ඇතුළත 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ සභා ආඥාව යටතේ හෝ අවුරුදු 5 ක කාලසීමාවක් ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනත යටතේ ඡන්ද හිමියකු ලෙස ලියාපදිංචි වීමට හෝ යම් ඡන්ද විමසීමකදී ඡන්දය දීමට හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වශයෙන් තෝරා පත් කරනු ලැබීමට හෝ පත් කරනු ලැබීමට ඔහු අපොහොසත් විය යුතු අතර එකී දිනයේ දී ඔහු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වශයෙන් තෝරා පත් කරනු ලැබ හෝ පත් කරනු ලැබ සිටී නම් ඒ දින සිට ඔහුගේ තෝරා පත්වීම හෝ පත්වීම අවලංගු විය යුතු ය:

(ආ) රජයේ සේවකයකු වශයෙන් සේවයේ යොදවනු ලැබීමට සහ උපලේඛනගත ආයතනයකට හෝ උපලේඛනගත ආයතනයක පාලක මණ්ඩලයට තෝරා පත් කරනු ලැබීමට හෝ පත් කරනු ලැබීමට ඔහු සදහට ම නුසුදුසු විය යුතු ය;

(ඇ) ඔහු උපලේඛනගත ආයතනයක හෝ උපලේඛනගත ආයතනයක පාලක මණ්ඩලයක සාමාජිකයකු නම් , ඒ වරදකරු කිරීමේ හෝ තීරණයේ දින සිට ඔහුගේ ඒ සාමාජිකත්වය අවසන් වියයුතුය; තවද ,

(ඈ) ඔහු රජයේ සේවකයකු නම් ඒ වරදකරු කිරීමේ හෝ තීරණයේ දින සිට ඔහු රජයේ සේවකයකුවීම අවසන් විය යුතු අතර වෙනත් ලිඛිත නීතියක පටහැනි ව කුමක් සඳහන් වුව ද . එය නොතකා ඔහු අස් කිරීමට නීතියෙන් බලය ලබා ඇති බලධරයා විසින් එකී දින දී ඔහු සේවයෙන් අස් කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

මෙම කොටස යටතේ වූ වැරදි සංඥෙය බව

30. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහයේ පළමු වන උපලේඛනයෙහි කුමක් ඇතුළත් වුව ද , එය නොතකා මේ පනතේ මෙම කොටස යටතේ වූ සියලුම වැරදි එකී සංග්‍රහයේ විධි විධාන අදාල කිරීමේ කාර්යය සඳහා සංඥෙය වැරදි විය යුතු ය.

නීති විරෝධී තුවු පඩුරක් ලබා ගත්තා තැනැත්තකු අල්ලා ගනු ලැබූ විට කාර්ය පටිපාටිය.

(1994 අංක 20 § 6)

30 (අ) (1) යම් නීතිවිරෝධී තුවු පඩුරක් භාරගත්තා, අයැදිත හෝ පිරිනමන යම් තැනැත්තකු කොමිෂන් සභාවට සහාය වීම පිණිස පත් කරන ලද යම් නිලධරයකු විසින් අල්ලා ගනු ලැබූ අවස්ථාවක, ඒ නිලධරයා විසින් -

(අ) ඒ තැනැත්තා අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව යම් මහේස්ත්‍රාත්වරයකු ඉදිරියට ගෙනයා යුතුය ; හෝ

(ආ) ඒ තැනැත්තා නීති විරෝධී තුවු පඩුරක් භාර ගැනීමේ දී. අයැදීමේ දී. හෝ පිරිනැමීමේ දී අල්ලා ගනු ලැබූ බවට අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අත්සන යටතේ වූ සහතිකයක් සමග යම් මහේස්ත්‍රාත්වරයෙකු වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය ; නැතහොත්

(ඇ) (අ) ඡේදයෙහි හෝ (ආ) ඡේදයෙහි සඳහන් තැනැත්තා විසින් නීතිවිරෝධී තුඩු පඩුරක් ලෙස භාර ගන්නා ලදැයි, අයදින ලදැයි හෝ පිරිනමන ලදැයි කියනු ලබන මුදල් නෝට්ටු කිසිවක්, ඒ නෝට්ටු එසේ භාර ගන්නා ලදැයි , අයදින ලදැයි හෝ පිරිනමනු ලදැයි කියනු ලබන බවට, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අත්සන යටතේ වූ වාර්තාවක් ද සමග මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උප වගන්තියේ (ආ) ඡේදය යටතේ යම් තැනැත්තකු යම් මහේස්ත්‍රාත් වරයකු වෙත ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක. මහේස්ත්‍රාත්වරයා විසින් ඒ තැනැත්තා නඩු විභාගය අවසන් වන තෙක් රිමාන්ඩ් භාරයේ තැබිය යුතුය.

එසේ වුව ද මහේස්ත්‍රාත් වරයා විසින් අතිවිශේෂ අවස්ථාගත කරුණු යටතේ හා වාර්තා ගත කළයුතු කරුණු මත . ඒ තැනැත්තා නඩු විභාගය අවසන් වීමට පෙර ඕනෑම අවස්ථාවක ඇප පිට මුදාහරිනු ලැබිය හැකිය.

(3) (1) වන උප වගන්තියේ ( ඇ ) ඡේදය යටතේ මුදල් නෝට්ටු කිසිවක් යම් මහේස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක. සහතිකයේ දැක්වෙන වටිනාකමින් යුත් හා අංක දරණ මුදල් නෝට්ටු තමා වෙත ඉදිරිපත් කරන ලද බවට තමාගේ අත්සන යටතේ වූ සහතිකයක් මහේස්ත්‍රාත්වරයා විසින් නිකුත් කරනු ලැබිය යුතු අතර, ඒ නෝට්ටු භාරගන්නා ලදැයි , අයැදින ලදැයි හෝ පිරිනමනු ලදැයි කියනු ලබන තැනැත්තාට විරුද්ධව පවරනු ලැබූ යම් නඩු කටයුත්තක දී ඒ නෝට්ටු ඉදිරිපත් කිරීම වෙනුවට, ඒ සහතිකය ආවේශ්‍ය කරගනු ලැබිය යුතු ය.

(4) (2) වන උප වගන්තියේ විධි විධානවල කුමක් සඳහන්ව ඇත ද, (1) වන උප වගන්තියේ (අ) ඡේදය හෝ (ආ) ඡේදය යටතේ වූ යම් නඩු කටයුත්තක දී , අත් අඩංගුවේ සිටින තැනැත්තාට විරුද්ධව නඩු පැවරීමට කොමිෂන් සභාව අදහස් නොකරන බව, කොමිෂන් සභාව විසින් මහේස්ත්‍රාත්වරයාට දැනුම් දෙනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා නොපමාව ම නිදහස් කරනු ලැබිය යුතු ය.

## III කොටස
## පරීක්ෂණ කොමිෂන් සභා

(1980 අංක 9§1 9) 31. ඉවත් කරන ලදි.

අල්ලස් චෝදනා විමර්ශනය කිරීම සඳහා පරීක්ෂණ කොමිෂන් සභා පත් කිරීමට ඇති බලය.

32. (1) (අ) සාමාන්‍යයෙන් අමාත්‍ය මණ්ඩලයට හෝ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ට හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයන්ට හෝ ජනාධිපතිවරයා විසින් යම් ධුරයකට පත් කරනු ලැබූ තැනැත්තන්ට හෝ යම් උප ලේඛනගත ආයතනයක සාමාජිකයන්ට, අධ්‍යක්ෂවරුන්ට හෝ පාලක මණ්ඩලයට විරුද්ධ ව කරනු ලැබූ හෝ

(ආ) මෙම උපවගන්තියේ (අ) ඡේදයෙහි නිශ්චිත ව සඳහන් යම් විශේෂ තැනැත්තකුට හෝ තැනැත්තන්ට විරුද්ධ ව කරනු ලැබූ

අල්ලස් චෝදනා පරීක්ෂා කොට වාර්තා කිරීම සඳහා සාමාජිකයන් එක් කෙනෙකු ගෙන් හෝ ඊට වැඩි ගණනකින් සමන්විත පරීක්ෂණ කොමිෂන් සභාවක් ජනාධිපතිවරයා විසින් ජනරජයේ පොදු මුද්‍රාව යටතේ නිකුත් කරනු ලැබූ බල පත්‍රයක් මඟින් පත් කළ යුතු ය.

(2) පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ නිකුත් කරනු ලබන බල පත්‍රයක දැක්විය යුතු යැයි එකී පනතේ 2 වන වගන්තියේ (2) වන උප වගන්තියෙන් නියමිත විස්තර මෙම පනත යටතේ පරීක්ෂණ කොමිෂන් සභාවක් පත් කිරීමේ බල පත්‍රයක ඇතුළත් විය යුතු ය

පරීක්ෂණ කොමිෂන් සභා පනතේ විධිවිධාන අදාළ කිරීම.

33. මෙම පනත යටතේ පරීක්ෂණ කොමිෂන් සභාවක් පත් කරනු ලැබූ විට, පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තියේ විධිවිධාන හා 17 වන වගන්තියේ විධිවිධාන නොවන ඒ පනතේ විධිවිධාන, ඒ පනත යටතේ එකී කොමිෂන් සභාව පත් කරනු ලැබූ ආකාරයෙන් අදාළ විය යුතු ය.

පරීක්ෂණ කොමිෂන් සභාවල බලතල

34. (1) පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ ඇති බලතලවලට අතිරේකව -

(අ) කොමිෂන් සභාව ඉදිරියෙහි වූ නඩු කටයුතුවල දී යම් තැනැත්තකු වෙත නිකුත් කරනු ලබන සිතාසිය 12 වන වගන්තියේ (අ), (ආ), (ඇ), (ඈ) සහ (ඉ) ඡේදවල නිශ්චිත ව සඳහන් යම් ආකාරයකින් භාරදීමට සැලැස්වීමේ බලය ;

(ආ) සිතාසියට අකීකරු වූ අවස්ථාවක සිර භාරයට ගැනීමේ වරෙන්තු නිකුත් කිරීමේ බලය;

(ඇ) කොමිෂන් සභාව විසින් පරීක්ෂණයක් පවත්වන්නේ යම් තැනැත්තකු හෝ තැනැත්තන් සම්බන්ධයෙන් ද, ඒ තැනැත්තාට නැතහොත් ඒ එක් එක් තැනැත්තාට ද, ඒ තැනැත්තාගේ භාර්යාවට නොහොත් ස්වාමි පුරුෂයාට හෝ ඔහු ප්‍රතුන්ට ද අයත් හෝ ඔවුන් සතු සියලු ම චංචල හෝ නිශ්චල දේපළ අංකිත ව දැක්වෙන්නා වූ ද, ඒ එක් එක් දේපළක් මිලයට ගැනීමෙන්, ත්‍යාග වශයෙන, අන්තිම කැමති පත්‍රයකින්, උරුමයකින් හෝ අන් ලෙසකින් අත්කර ගත් දිනය නිශ්චිත ව සඳහන් වූ ද, දිවුරුම් පිට කරන ලද ලිඛිත ප්‍රකාශයක් සපයන ලෙස ලිඛිත දැන්වීමක් මඟින් ඒ තැනැත්තාට හෝ එක් එක් තැනැත්තාට නියම කිරීමේ බලය ;

(ඈ) වෙන යම් තැනැත්තකුට අයත් හෝ ඔහු සතු යම් චංචල හෝ නිශ්චල දේපළක තොරතුරක් පරීක්ෂණයේ දී උපකාර වෙයැයි විශ්වාස කිරීමට කොමිෂන් සභාවට සැහෙන කරුණු ඇති විටෙක, ඒ තැනැත්තාට අයත් හෝ ඔහු සතු සියලු ම චංචල හෝ නිශ්චල දේපළ අංකිත ව දැක්වෙන, දිවුරුම් පිට කරන ලද ලිඛිත ප්‍රකාශයක් සපයන ලෙස ලිඛිත දැන්වීමක් මඟින් ඒ තැනැත්තාට නියම කිරීමේ බලය.

(ඉ) පරීක්ෂණයට භාජන වූ තැනැත්තා හෝ එක් එක් තැනැත්තා පිළිබඳ ව ද, ඒ තැනැත්තාගේ භාර්යාව නොහොත් ස්වාමි පුරුෂයා සහ *ළමා පුතුන් පිළිබඳ ව ද, 4 වන වගන්තිය යටතේ අල්ලස් කොමසාරිස් විසින් ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබිය හැකි පොත් හා නීත්‍යානුකූල ලේඛන ඉදිරිපත් කරන ලෙස ද, සපයන ලෙස නියම කළ හැකි සහතික පිටපත් හා වෙනත් තොරතුරු සපයන ලෙස ද ලිඛිත දැන්වීමක් මගින් යම් බැංකුවකට හෝ රජයේ දෙපාර්තමේන්තුවකට, කාර්යාලයකට හෝ ආයතනයකට හෝ යම් පළාත් පාලන ආයතනයකට හෝ උප ලේඛනගත ආයතනයකට නියම කිරීමේ බලය : සහ (1958 අංක40§ 20

(ඊ) කොමිෂන් සභාව පිහිටුවන බල පත්‍රය මගින් හෝ ඊට පසුව නිකුත් කරනු ලබන වෙනත් බල පත්‍රයක් මගින් ජනාධිපති වරයා විසින් කොමිෂන් සභාව වෙත පැවරිය හැකි වෙනත් බලතල , පරීක්ෂණ කොමිෂන් සභාවකට තිබිය යුතු ය.

(2) පරීක්ෂණ කොමිෂන් සභාවක් විසින් නිකුත් කරනු ලබන සිර භාරයට ගැනීමේ වරෙන්තුවක්

(අ) කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් අත්සන් කොට තිබිය යුතු හෝ කොමිෂන් සභාව එක ම කොමසාරිස්වරයෙකුගෙන් සමන්විත නම් ඒ කොමසාරිස්වරයා විසින් අත්සන් කොට තිබිය යුතු අතර,

(ආ) එය යවනු ලැබූ යම් පොලිස් නිලධරයකු විසින් ක්‍රියාත්මක කළ යුතු ය.

එබඳු යම් සිරභාරයට ගැනීමේ වරෙන්තුවක් සඳහා කිසි ම මුද්දර ගාස්තුවක් නොගෙවිය යුතු ය.

(3) (1) වන උප වගන්තියේ (ඇ) ඡේදය යටතේ පරීක්ෂණ කොමිෂන් සභාව ලබා ගත් සියලු ම තොරතුරු, පරීක්ෂණ කොමිෂන් සභාව විසින්, ඉතාමත් ම රහසිගත ව තබා ගත යුතු අතර අල්ලස් කොමසාරිස්වරයාට, පරීක්ෂණයට භාජනය වූ තැනැත්තාට හෝ ඒ තැනැත්තා වෙනුවෙන් පෙනී සිටින නීතිඥවරයකුට හැර වෙන තැනැත්තකුට ඒ තොරතුරු එළිදරව් නොකළ යුතු ය. (1958 අංක40§ 20

35. යම් තැනැත්තකු සම්බන්ධයෙන් පරීක්ෂණ කොමිෂන් සභාවක් විසින් පරීක්ෂණයක් පවත්වනු ලැබේද, ඒ තැනැත්තා විසින් එකී පරීක්ෂණයට පැමිණ සිටීම ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ අතපසු කරනු ලැබුවහොත්, ඔහු පැමිණ නොසිටිය දී ම කොමිෂන් සභාව විසින් පරීක්ෂණය පවත්වා ගෙනයා හැකි ය. සම්බන්ධ තැනැත් පැමිණ නොසිටි නමුදු විභාගය පැවැත්විය හැකි බව.

---

*සම්පාදක සටහන:

1994 අංක 20 දරන අල්ලස් (සංශෝධන) පනතේ 2 වන වගන්තිය මගින් අල්ලස් පනතේ 4 වන වගන්තිය ඉවත්කර ඇති අතර සමාන්තර ප්‍රතිපාදන 1994 අංක 19 දරන පනතේ 5 වන වගන්තියේ දැක්වේ.

සාක්ෂි දිය යුතු භාෂාව

36. (1) පරීක්ෂණ කොමිෂන් සභාවක් ඉදිරිපිට දෙනු ලබන සාක්ෂි, එකී සභාව විසින් සුදුසු යැයි සලකනු ලබන භාෂාවකින් සටහන් කරවිය හැකි ය.

(2) කොමිෂන් සභාවේ යම් සාමාජිකයකුහට නොවැටහෙන භාෂාවකින් ඒ පරීක්ෂණ කොමිෂන් සභාව ඉදිරිපිට යම් සාක්ෂියක් දෙනු ලබන විට ඒ සාමාජිකයාට වැටහෙන භාෂාවකට එය පරිවර්තනය කළ යුතු ය.

පරීක්ෂණ කොමිෂන් සභාවට අපහාස කිරීමේ වරද අභියාචනා අධිකරණයේ සභාපතිවරයාට දැන්විය යුතු බව.

37. (1) පරීක්ෂණ කොමිෂන් සභාවක බලයට විරුද්ධ ව හෝ අගෞරව වන පරිදි කරනු ලබන සෑම අපහාස කිරීමේ වරදක් ම කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ අත්සනින් යුතු ලිපියක් මගින් හෝ කොමිෂන් සභාව එක ම කොමසාරිස්වරයකුගෙන් සමන්විත නම් ඒ කොමසාරිස්වරයාගේ අත්සනින් යුතු ලිපියක් මගින් අභියාචනාධිකරණයේ සභාපතිවරයාට දැන්විය යුතු ය.

(2) පරීක්ෂණ කොමිෂන් සභාවකින් (1) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමක් ලැබුණු විට, ඒ කොමිෂන් සභාවේ බලයට විරුද්ධ ව හෝ අගෞරව වන පරිදි අපහාස කිරීම සම්බන්ධයෙන් ඒ දැන්වීමේ නම් කරනු ලැබූ තැනැත්තා වෙත අධිකරණයට අපහාස කිරීම පිළිබඳ "තයිසයි " ආඥාවක් අභියාචනාධිකරණයේ සභාපතිවරයා විසින් නිකුත් කළ යුතු ය.

(3) යම් තැනැත්තකු වෙත (2) වන උප වගන්තිය යටතේ වූ "තයිසයි " ආඥාවක් නිකුත් කරනු ලැබූ විට, ඒ තැනැත්තා විසින් අභියාචනාධිකරණය සෑහීමට පත් වන පරිදි හේතු නොදක්වන ලද නම්, ඔහු දඬුවම් කරනු ලැබීමට යටත් විය යුතු ය.

(4) පරීක්ෂණ කොමිෂන් සභාවක බලයට විරුද්ධ ව හෝ අගෞරව වන පරිදි කරන ලද අපහාස කිරීමේ වරදක් ගැන යම් තැනැත්තකුට විරුද්ධ යම් නඩු කටයුත්තක දී ඒ කොමිෂන් සභාවේ කිසි ම සාමාජිකයකු ඒ තැනැත්තා විසින් සාක්ෂිකරුවකු වශයෙන් කැඳවනු ලැබීමට යටත් නොවිය යුතු නමුදු එසේ කිරීම අවශ්‍ය යැයි අභියාචනාධිකරණය විසින් සලකනු ලැබුවහොත්, අභියාචනාධිකරණය විසින් ඒ කොමිෂන් සභාවේ සාමාජිකයෙකුගෙන් ප්‍රශ්න ඇසිය හැකි ය.

පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව ප්‍රසිද්ධ කිරීම.

38. (1) පරීක්ෂණ කොමිෂන් සභාවක වාර්තාව ප්‍රසිද්ධ කිරීමෙන් මහජන යහපතට හානියක් නො වේ යැයි තම අදහස වුවහොත් එකී වාර්තාව ප්‍රසිද්ධ කරන ලෙස ජනාධිපති වරයා විසින් නියම කළ යුතු ය.

(2) මහජන යහපතට හානියක් වේ ය යන හේතුව පිට පරීක්ෂණ කොමිෂන් සභාවක වාර්තාව ප්‍රසිද්ධ නොකිරීමට ජනාධිපති වරයා විසින් තීරණය කරනු ලැබූ අවස්ථාවක පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවක් මගින් එසේ කරන ලෙස ඉල්ලා සිටි විට, ඒ වාර්තාව ප්‍රසිද්ධ කරන ලෙස ඔහු විසින් නියම කළ යුතු ය.

තුටු පඬුරක් භාර ගැනීම නිසා තැනැත්තකු අල්ලස් පිළිබඳව වරදකරු බැව් පරීක්ෂණ කොමිෂන් සභාව තීරණය කළ අවස්ථාවක ඒ තුටු පඬුරේ වටිනාකම තක්සේරු කිරීම (1965 අංක 2 § 16)

(39) (1) යම් තැනැත්තකු තුටු පඬුරක් භාර ගැනීම නිසා අල්ලස් පිළිබඳ ව වරදකරු වූ බව පරීක්ෂණ කොමිෂන් සභාවක් විසින් තීරණය කරන අවස්ථාවක -

(අ) එම තුටු පඬුර මුදලක් නම් කොමිෂන් සභාව විසින් එහි ප්‍රමාණය හෝ තුටු පඬුරේ වටිනාකම තක්සේරු කළ හැකි නම් කොමිෂන් සභාව විසින් එය තක්සේරු කොට එහි වටිනාකම තම වාර්තාවෙහි ප්‍රකාශ කළ යුතුය. තවද,

(ආ) නීතිපතිවරයා විසින් ඒ තීරණය ඒ තැනැත්තාට ලියා දැන්විය යුතු අතර තුටු පඬුරෙහි ගණනක් හෝ වටිනාකමක් ලෙස මුදල් ප්‍රමාණයක් ඒ වාර්තාවෙහි නිශ්චිත ව සඳහන් ව තිබේ නම්, නියමයෙහි නිශ්චිත ව සඳහන් විය හැකි කාලයක් ඇතුළත ඒ මුදල තමා වෙත ගෙවන ලෙස නීතිපතිවරයා විසින් ඒ තැනැත්තාට නියම කළ යුතුය.

(2) ගෙවිය යුතු ලෙස (1) වන උප වගන්තිය යටතේ නීතිපතිවරයා විසින් නියම කරනු ලැබූ මුදල යම් තැනැත්තකු විසින් (1980 අංක9§ 20) නොගෙවනු ලැබුවහොත්, ඒ තැනැත්තා විසින් ඒ මුදල ගෙවන ලෙස ආඥාවක් කරන මෙන් මහාධිකරණයෙන් ඉල්ලීම නීතිපතිවරයා විසින් කළ හැකි අතර ඒ මහාධිකරණය විසින් එම ඉල්ලීම උඩ එබඳු ආඥාවක් කළ යුතු ය.; තව ද ඒ ආඥාවෙන් ඉඩ දෙනු ලැබූ කාලය ඇතුළත ඒ තැනැත්තා විසින් ඒ මුදල ගෙවනු නොලැබුවහොත්, ඒ ආඥාව රජයේ වාසියට හා ඒ තැනැත්තාට විරුද්ධ ව දිසා අධිකරණය විසින් කරනු ලැබූ තීන්දු ප්‍රකාශයක් වූ ආකාරයෙන් ම ඒ මුදල අය කර ගත හැකි ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් මුදල ගෙවීමට යටත් තැනැත්තා. ඔහු විසින් තුටු පඬුර භාර ගනු ලැබූ දිනයෙහි රජයේ (1980 අංක9§ 20) සේවකයකු ව සිටියේ නම්, ඒ මුදල අය කර ගැනීමේ කාර්යය සඳහා එම මුදල 26 වන වගන්තිය යටතේ මහාධිකරණය විසින් නියම කරන ලද දණ්ඩන මුදලක් වූ ආකාරයෙන් 28 වන වගන්තියේ (3) වන උපවගන්තියෙහි විධි විධාන අදාළ විය යුතු ය.

(4) (2) වන උපවගන්තියෙහි සඳහන් මුදල අය කර ගැනීම සඳහා මහාධිකරණයෙහි වූ නඩු කටයුත්තකදී, තුටු පඬුරේ ගණන හෝ (1980 අංක9§ 20) වටිනාකම ලෙස කොමිෂන් සභාව විසින් ප්‍රකාශ කරනු ලැබූ මුදල පිළිබඳ ව ප්‍රශ්න කිරීමේ බලය ඒ උසාවිය හෝ කිසිවකු සතු නො විය යුතු ය.

## iv වන කොටස

අවලංගු කරන ලදී. ( 1965 අංක 2 § 17)

## V වන කොටස
## අල්ලස් නොවන වැරදි

දූෂණය
(1994අංක 20§ 7)

70. ආණ්ඩුවට අයුතු සහගත ලෙස හෝ නීතිවිරෝධී ලෙස පාඩු සිදු කිරීමේ තමා වෙත හෝ යම් තැනැත්තකු වෙත අයුතු සහගත ලෙස හෝ නීතිවිරෝධී ලෙස අර්ථ ලාභයක් අනුග්‍රහයක් හෝ වාසියක් සිදු කිරීමේ චේතනාවෙන්, හෝ ආණ්ඩුවට හෝ යම් තැනැත්තකුට අයුතු සහගත ලෙස හෝ නීතිවිරෝධී ලෙස පාඩු සිදුවිය හැකි බව නැතහොත් යම් තැනැත්තකුට අයුතු සහගත ලෙස හෝ නීතිවිරෝධී ලෙස අර්ථ ලාභයක්, අනුග්‍රහයක් හෝ වාසියක් සැලසෙන බව දැන දැනම පහත දැක්වෙන යම් ක්‍රියාවක්, එනම්

(අ) රජයේ සේවකයකු වශයෙන් වූ ස්වකීය ධුරය ප්‍රකාර කිරීමට තමාට බලය පැවරී ඇති යම් ක්‍රියාවක් කරන හෝ කිරීමෙන් වැලකී සිටින ;

(ආ) රජයේ සේවකයකු වශයෙන් වූ ස්වකීය ධුරය ප්‍රකාර කිරීමට වෙනත් යම් රජයේ සේවකයකුට බලය පැවරී ඇති යම් ක්‍රියාවක් ඉටු කිරීමට හෝ ඉටු කිරීමෙන් වැලකී සිටීමට, වෙනත් යම් රජයේ සේවකයකු පොලඹවන ;

(ඇ) රජයේ සේවකයකු වශයෙන් වූ ස්වකීය ධුරය ප්‍රකාර තමාට දැනගැනීමට ලැබෙන යම් තොරතුරක් පාවිච්චි කරන ;

(ඈ) රජයේ සේවකයකු වශයෙන් වූ ස්වකීය ධුරය ප්‍රකාර යම් තීරණයක් ගැනීමෙහි සහභාගි වන:

(ඉ) රජයේ සේවකයකු වශයෙන් වූ ස්වකීය ධුරය කෙලින් ම හෝ අන්‍යාකාරයකින් හෝ පාවිච්චි කිරීමෙන් යම් ක්‍රියාවක් ඉටු කිරීමට හෝ ඉටු කිරීමෙන් වැලකී සිටීමට වෙනත් යම් තැනැත්තකු පොලඹවන

යම් රජයේ සේවකයකු දූෂණය පිළිබඳ වරද සම්බන්ධයෙන් වරදකරු විය යුතු අතර. මහේස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට අවුරුදු 10 ක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාර ගත කිරීමකට හෝ රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම හා දඩය යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය

තොරතුරු සැපයීම පැහැර හැරීම
(1980අංක9 § 22)
(1994අංක20 § 8)

71. වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවල හෝ යම් රහස්‍ය දිවුරුමක හෝ මීට පටහැනිව කුමක් සඳහන් වුව ද 34 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ පරීක්ෂණ කොමිෂන් සභාවක් විසින් හෝ දැන්වීමක් යවනු ලැබූ සෑම තැනැත්තකු ම ඒ දැන්වීමෙහි සඳහන් කරනු ලබන කාලය ඇතුළත ඒ දැන්වීමේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු අතර, එසේ කිරීම ඔහු ඕනෑකමින් ම අතපසු කළහොත් හෝ නොකර හැරියහොත් ඔහු වරදකට වරදකරු වන අතර. මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ වරදකරු කරනු ලැබූ විට -

(අ) රුපියල් සියයකට නොඅඩු සහ රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ දෙයාකාරයෙන් එක් ආකාරයක මාස හයක කාලයක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම: සහ

(ආ) දිවුරන ලද ප්‍රකාශය ඉදිරිපත් කිරීමට ඔහුට නියම කරනු ලැබුවේ යම් දිනයක ද ඒ දිනයෙන් පසු වරද නොකඩවා කරගෙන යනු ලැබූ සෑම දිනයක් සඳහා ම රුපියල් සියයක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය.

72. ඉවත් කරන ලදි. (1994 අංක 20 §

73. (1) (අ) අල්ලස් ගැනීම සම්බන්ධයෙන් යම් නඩු කටයුත්තක දි යම් අධිකරණයකට හෝ පරීක්ෂණ කොමිසමකට නැතහොත්, අධිකරණයක් ඉදිරියට හෝ පරීක්ෂණ කොමිසමක් ඉදිරියට හෝ කැඳවනු ලැබූ යම් සාක්ෂිකරුවකුට හෝ බාධා කරන්නා වූ, හෝ

සාක්ෂිකරුවන්ට බාධා කිරීම
1980 අංක 9 § 2
1994 අංක20§ 1

(ආ) සාක්ෂි දීමෙන් වැළකී සිටීමට එවැනි යම් සාක්ෂිකරුවකු පොළඹවන්නා වූ, හෝ 1994අංක20 § 1

(ඇ) එවැනි යම් සාක්ෂිකරුවකු සාක්ෂිදීම වැළැක්වීම පිණිස ඔහුගේ ශරීරයට, සිතට හෝ කීර්තියට හානි කරන බවට තර්ජනය කරන්නා වූ, හෝ 1994අංක20 § 1

(ඈ) එවැනි යම් සාක්ෂිකරුවකු හෝ සාක්ෂි දීමෙන් වැළැක්වීමට ඔහුගේ ශරීරයට, සිතට හෝ කීර්තියට හානි කරන්නා වූ. හෝ 1994අංක20 § 1

(ඉ) එවැනි යම් සාක්ෂිකරුවකුට සාක්ෂි නොදීමට බල කරන්නා වූ 1994අංක20 § 1

යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, ලඝු නඩු විභාගයකින් පසු මහේස්ත්‍රාත්වරයෙකු විසින් වරදකරු කරනු ලැබූ විට මාස දොළහක් නොඉක්මවන්නා වූ කාලයක් බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමකට සහ දඩයකට යටත් විය යුතු ය.

(2) මේ වගන්තිය යටතේ වරදක් කර ඇති බවට හෝ කිරීමෙහි ලා සම්බන්ධ වී ඇති බවට හෝ එවැනි වරදක් කර ඇතැයි හෝ කිරීමෙහි ලා සම්බන්ධ වී ඇතැයි සැක කරන බවට වූ චෝදනාවක් මත යම් තැනැත්තකු තමා විසින් ම භාරවන්නේ නැතහොත් අත් අඩංගුවට ගෙන ඉදිරිපත් කරනු ලබන්නේ යම් අධිකරණයක් වෙත ද ඒ සෑම අධිකරණයක් විසින් ම, ඔහු ඇප පිට නිදහස් කිරීම සඳහා එම අධිකරණයට ඇති හේතු වාර්තාගත කිරීමෙන් පසුව ඔහු නිදහස් කරනු ලැබිය හැකි අසාමාන්‍ය අවස්ථාවලදී හැර,. නඩු විභාගය අවසන් වන තෙක් ඔහු රිමාන්ඩ් භාරයෙහි තැබිය යුතු ය.

74. (1) පරීක්ෂණ කොමිෂන් සභාවක යම් සාමාජිකයකුට ඔහුගේ යුතුකම ඉටු කිරීමේ දි කෙලින් ම හෝ අත් අයුරකින් බලපාන තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර මහේස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙසීයයකට අඩු නොවන සහ රුපියල් පන්සීයයකට වැඩි නොවන දඩයකට යටත් විය යුතු ය.

පරීක්ෂණ කොමිෂන් සභාවෙ සාමාජිකයකුට හෝ මෙම පනත යටතේ පත්කරනු ලැබූ නිලධරයකුට බලපෑම්, තර්ජනය කිරීම හෝ හානි කිරීම.
(1965 අංක 2 §20
(1994අංක 20 §1

(1965අංක 2 §20)
(1994අංක20 §11)

(2) පරීක්ෂණ කොමිෂන් සභාවක යම් සාමාජිකයකු ඔහුගේ යුතුකම් ඉටු කිරීමෙන් වැළැක්වීම සඳහා ඔහුගේ කයට, සිතට හෝ කීර්තියට යම් හානියක් කිරීමට ලිඛිත හෝ කථික වචන මගින් හෝ යම් ක්‍රියාවක් මගින් කෙළින් ම හෝ අන් අයුරකින් තර්ජනය කරන තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර මහේස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙසියයකට අඩු නොවන සහ රුපියල් පන්සියයකට වැඩි නොවන දඩයකට යටත් විය යුතු ය. තව ද දෙවන වරට හෝ ඉන් පසුව මෙම උපවගන්තිය යටතේ වූ වරදකට වරදකරු කරනු ලැබූ විට, ඒ දඩයට අතිරේක ව අවුරුද්දක් නොඉක්මවන කාලයක බන්ධනාගාර කිරීමකට ඔහු යටත් විය යුතු ය.

(1965 අංක 2§20)
(1994අංක20 §11)

(3) පරීක්ෂණ කොමිෂන් සභාවක සාමාජිකයකු ඔහුගේ යුතුකම් ඉටු කිරීමෙන් වැළැක්වීම සඳහා ඔහුගේ කයට, සිතට හෝ කීර්තියට හානි සිදු කරන තැනැත්තකු මහේස්ත්‍රාත් වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට මාස දොළහක් නො ඉක්මවන කාලයක බරපතල වැඩ ඇති බන්ධනාගාරගත කිරීමකට සහ දඩයකට යටත් විය යුතු ය.

පරීක්ෂණ කොමිෂන් සභාවකට අකීකරු වීම.
(1965අංක 2 §21)

75. (1) පරීක්ෂණ කොමිෂන් සභාවක ආඥාවක් ඉෂ්ට කිරීම ප්‍රතික්ෂේප කරන හෝ ඕනෑකමින් අතපසු කරන හෝ නොකර හරින හෝ ඒ කොමිෂන් සභාවට ඕනෑකමින් අවහිර කරන තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, මහේස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට මාස හයක් නොඉක්මවන කාලයක බරපතල වැඩ ඇති බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් සියයකට අඩු නොවන සහ රුපියල් පන්සියයකට වැඩි නොවන දඩයකට යටත් විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ වරදක් සඳහා නීතිපතිවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි මහේස්ත්‍රාත් අධිකරණයක නඩු පැවරීමක් කළ හැකි ය.

(1965අංක 2 §22) 76. අවලංගු කරන ලදී.

රහසිගත ව පැවැත්වූ නඩු කටයුතු සහ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව ප්‍රසිද්ධ කිරීම.
(1965අංක 2 §23)

77. (1) පරීක්ෂණ කොමිෂන් සභාවක යම් නඩු කටයුත්තකින් මහජනයා සහ ප්‍රවෘත්ති පත්‍ර වාර්තාකරුවන් ඉවත් කර තිබෙන අවස්ථාවක, කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ අත්සන යටතේ හෝ කොමිෂන් සභාව තනි කොමසාරිස්වරයකු ගෙන් සමන්විත නම් ඒ කොමසාරිස්වරයාගේ අත්සන යටතේ හෝ ලියවිල්ලකින් දෙනු ලැබූ කොමිෂන් සභාවේ අවසරය ඇතිව හැර, ඒ නඩු කටයුත්ත හෝ එහි යම් කොටසක් කිසි ම තැනැත්තකු විසින් මුද්‍රණය කිරීම හෝ ප්‍රසිද්ධ කිරීම නොකළ යුතු ය.

*(3) පරීක්ෂණ කොමිෂන් සභාවක වාර්තාවක් ජනාධිපතිවරයාගේ නියමය යටතේ ප්‍රසිද්ධ කරනු ලැබීමට පෙර, ඒ වාර්තාවේ යම් කොටසක් හෝ ඒ වාර්තාවේ කොටසක් හෝ උද්ධෘතයක් ලෙස හැඟවෙන දෙයක් කිසි ම තැනැත්තකු විසින් මුද්‍රණය කිරීම හෝ ප්‍රසිද්ධ කිරීම නොකළ යුතු ය.

(4) මෙම වගන්තියේ ඉහතින් වූ උපවගන්තිවලින් කිසිවක විධිවිධාන උල්ලංඝනය කරන තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර මහේස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙසියයකට අඩු නොවන සහ රුපියල් පන්සියයකට වැඩි නොවන දඩයකට යටත් විය යුතු ය; තව ද දෙවන වරට හෝ ඉන් පසුව මෙම උපවගන්තිය යටතේ වූ වරදකට වරදකරු කරනු ලැබූ විට ඒ දඩයට අතිරේක ව අවුරුද්දක් නොඉක්මවන කාලයක බරපතල වැඩ ඇති බන්ධනාගාරගත කිරීමකට ඔහු යටත් විය යුතු ය.

---

*1965 අංක 2 §23 දරන පනත මගින් (2) වන උපවගන්තිය ඉවත් කරන ලදී.

## VI වන කොටස

### සාමාන්‍ය කරුණු

78. (1) කොම්පත් සභාව විසින් හෝ කොම්පත් සභාවේ ලිඛිත අනුමතය ඇතිව හෝ හැර මේ පනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන් යම් නඩු පැවරීමක් කිසිදු මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් භාර ගනු නොලැබිය යුතු ය.

(2) අල්ලස් සම්බන්ධයෙන් අධිකරණයක නඩු කටයුතු , ඒ අධිකරණයෙහි වෙත යම් කාර්යයක විශේෂ හදිසි ස්වභාවය නිසා එසේ කළ නොහැකි නම් මිස, ඒ අධිකරණයෙහි වෙත යම් කාර්යයකට පෙර, කටයුතු සඳහා ගත යුතු ය.

(3) නීතිපතිවරයා විසින් හෝ ඔහු විසින් ඒ සඳහා බලය පවරනු ලැබූ නිලධරයකු විසින් ඒ සඳහා ඉල්ලීමක් කරනු ලැබූ විට, අල්ලස් සම්බන්ධයෙන් අධිකරණයක නඩු කටයුතු සම්පූර්ණයෙන් ම හෝ ඉන් යම් කොටසක් රහසිගත ව පැවැත්විය හැකි ය.

*(6) ජනාධිපතිවරයාගේ නියමය යටතේ ප්‍රසිද්ධ කරන ලද කොම්පත් සභාවක වාර්තාවට ඇතුළත් කිසිවක් අපහාස නඩුවකට නිමිත්ත කර නොගත යුතු අතර, එබඳු යම් වාර්තාවක ඇතුළත් යම් කිසිවක් පදනම් කොට ගත් අපහාස නඩුවක් කිසි ම අධිකරණයක් විසින් නොපිළිගත යුතු ය.

මෙම පනත යටතේ වූ වැරදි සම්බන්ධයෙන් නඩු පැවරීම සං අල්ලස් චෝදනා සම්බන්ධයෙන් හෝ සාක්ෂි වල දී කරනු ලබන ප්‍රකාශ සං වාර්තා හා තීර. සම්බන්ධ නඩු සහ නඩු කටයුතු (1965 අංක 2 § (1974 අංක 38§ (1980 අංක 9§ (1994 අංක 20§

79. (1) අධිකරණයක් හෝ පරීක්ෂණ කොම්ෂන් සභාවක් ඉදිරියෙහි වූ අල්ලස් පිළිබඳ යම් නඩු කටයුත්තක දී, තුටු පඬුරක් දෙන්නා තුටු පඬුර ගැනීම ගැන චෝදිත තැනැත්තාට විරුද්ධ ව සාක්ෂි දිය හැකි සාක්ෂිකරුවකු විය යුතු අතර ඔහු අපසහායකයකු ලෙස නොසලකනු ලැබිය යුතු ය; තව ද අධිකරණයේ හෝ කොම්ෂන් සභාවේ තීරණය හෝ තීන්දුව, ඒ තුටු පඬුර දෙන්නා ගේ තහවුරු නො වූ සාක්ෂිය මත ජනිත වීමේ හේතුවෙන් පමණක් නීති විරෝධී නොවිය යුතු ය.

තුටු පඬුරු දෙන තැනැත්තා අපරාධ සහායක ලෙස නො සැලකිය යුතු බව. (1965 අංක 2 § (1980 අංක 9 §

(2) මෙම පනත යටතේ යම් තැනැත්තකුට විරුද්ධ යම් නඩු කටයුත්තක දී ඒ තැනැත්තාගේ භාර්යාව හෝ ස්වාමි පුරුෂයා ශක්තුවත් සාක්ෂිකරුවකු විය යුතු ය.

80. ඉවත් කරන ලදි. 1994 අංක 20 §

81. (1) අල්ලස් සම්බන්ධයෙන් චෝදනා කරනු ලැබූ තැනැත්තකු පිළිබඳ නඩු විභාගය අවසාන වීමට පෙර යම් අවස්ථාවක, කෙලින් ම හෝ අන් අයුරකින් වරදට සම්බන්ධ ලෙස හෝ සම්බන්ධ තැනැත්තකු ව සිටි ලෙස කල්පනා කරනු ලබන යම් තැනැත්තකු ගේ සාක්ෂි නඩු විභාගයේ දී ලබා ගැනීමේ අදහසින් වරදට හා වරද කිරීමෙහි ලා මූලිකයා වශයෙන් නැතහොත් අනුබල දෙන්නා වශයෙන් සම්බන්ධ වූ අන් සෑම තැනැත්තකුට ම ද අදාළ තමා දන්නා කරුණු සියල්ල පිළිබඳ සම්පූර්ණ සහ සත්‍ය එළිදරව්වක් ඔහු විසින් කිරීමේ කොන්දේසිය පිට ඒ තැනැත්තාට සමාවක් දීම හෝ එසේ සමාව දීමට තමා විසින් නම් කරනු ලබන මහේස්ත්‍රාත්වරයකුට සිය අත්සන යටතේ ලියවිල්ලකින් බලය පැවරීම කොම්පත් සභාව විමසා නීතිපතිවරයා විසින් කළ හැකි ය.

කොන්දේසි සහිත සමාව දීම (1980 අංක 9 § 1994 අංක 20 §

---

*ජාතික රාජ්‍ය සභාව 1974 අංක 78 දරන පනත මගින් (4) සහ (5) උප වගන්තිඉවත් කරන ලදි.

(2) (1) වන උපවගන්තිය යටතේ සමාවක් පිළිගත්තා සැම තැනැත්තකුගේ දිවුරුම් පිට ලබා ගත යුතු සාක්ෂි අපරාධ නඩු විධාන සංග්‍රහය පනත මගින් නියමිත ආකාරයට මහේස්ත්‍රාත්වරයා විසින් සටහන් කර ගත යුතු අතර ඒ සටහන ඔහු විසින් කොම්පත් සභාවට යැවිය යුතු ය.

ලියුම හෝ විදුලි පණිවුඩය ලැබූ බව පූර්ව නිගමනය කිරීම

82. යම් සිතාසියක්, දැන්වීමක්, නියමයක්, තීරණයක් හෝ වෙනත් දෙයක් යම් තැනැත්තකු වෙත ලියාපදිංචි කල තැපෑලෙන් හෝ විදුලි පණිවුඩයක් මගින් යවා හෝ දැනුම් දී ඇති අවස්ථාවක, ඒ ලියුම හෝ විදුලි පණිවුඩය භාර නො දී ආපසු එවා ඇතහොත් මිස, ඒ ලියුම හෝ විදුලි පණිවුඩය සඳහා තැපැල් කාර්යාලයෙන් නිකුත් කරනු ලැබූ කුවිතාන්සිය ඉදිරිපත් කරනු ලැබූ විට, ඒ ලියුම හෝ විදුලි පණිවුඩය ලිපිනය හිමි තැනැත්තා විසින් ලැබූ බව පූර්ව නිගමනය කල යුතු ය.

(1958 අංක 40 §65) 83. ඉවත් කරන ලදි.

උපලේඛනය සංශෝධනය කිරීම
(1958 අංක 40 §67)

84. අධිකරණ අමාත්‍යවරයාගේ අනුශාසනය පිට ජනාධිපතිවරයා විසින්, ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන ප්‍රකාශනයක් මගින් මෙම පනතේ උපලේඛනය සංශෝධනය කල හැකි ය.

(1994 අංක 20 §15) 85. ඉවත් කරන ලදි.

මෙම පනත යටතේ වූ යම් නඩු විභාගයක දී හෝ පරීක්ෂණයක දී සාක්ෂි දීම සඳහා පැමිණ සිටින තැනැත්තන්ගේ වියදම්

85. අ. මෙම පනත යටතේ වූ යම් නඩු විභාගයක දී හෝ පරීක්ෂණයක දී සාක්ෂි දීම සඳහා පැමිණ සිටින තැනැත්තකුට, ඒ නඩු විභාගයට හෝ පරීක්ෂණයට පැමිණ සිටීමේ වියදම්, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ XIX වන පරිච්ඡේදය යටතේ සාක්ෂිකරුවන් සඳහා කලින් කල නියම කරනු ලබන ප්‍රමාණයන්ට අනුව සහ එහි නියමිත කොන්දේසිවලට යටත් ව ලංකාවේ ඒකාබද්ධ අරමුදලෙන් ගෙවිය හැකි ය.

1958 අංක 40 §69
1980 අංක 9 §27
අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 303(5) වන වගන්තියෙහි විධිවිධාන මේ පනතේ 29 වන වගන්තියෙහි විධිවිධාන අදාළ වන තැනැත්තන් කෙරෙහි අදාළ නොවිය යුතු බව
(1980 අංක 9 §28)

85. ආ. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 303(5) වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් ව ඇත ද, අල්ලස් පිළිබඳව වරදකරු කරනු ලැබුවා වූද, ඒ වරදකරු කිරීම වෙනුවෙන් අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 303(1) වන වගන්තිය යටතේ අත්හිටවූ සිර දඬුවමක් පනවන ලද තැනැත්තකු වන්නා වූ ද යම් තැනැත්තකු කෙරෙහි මේ පනතේ 29 වන වගන්තියෙහි විධිවිධාන අදාළ විය යුතු ය.

අන්තර්කාලීන විධිවිධාන
(1980 අංක 9 §28)

85. (ඇ) රුපියල් දෙසියයක් නොඉක්මවන යම් මුදලක හෝ රුපියල් දෙසියයක් නොඉක්මවන වටිනාකමක හෝ තුටු පඬුරක් ඇයැදීමේ, භාර ගැනීමේ හෝ පිරිනැමීමේ වරදක් සම්බන්ධයෙන් මේ වගන්තිය ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව වූ දිනයෙහි (1980 ජනවාරි මස 24 වන දිනයෙහි) මහාධිකරණයෙහි විනිශ්චයට භාජනව ඇති යම් නඩුවක්, මහේස්ත්‍රාත් අධිකරණය වෙත මාරු කරනු ලැබිය යුතු යැයි වරදෙහි ස්වභාවය සහ අවස්ථානුගත වෙනත් කරුණු ගැන සැලකිල්ලෙන් ව, මහාධිකරණය විසින් තීරණය කරනු ලැබුවහොත්, ඒ නඩුව මහේස්ත්‍රාත් අධිකරණයට භාර විය යුතු අතර, එය සංජානනය කිරීමට ද විභාග කිරීමට ද තීරණය කිරීමට නැතහොත් අවසන් කිරීමට ද අධිකරණ බලය, ඒ මහේස්ත්‍රාත් අධිකරණයට තිබිය යුතු ය.

එසේ වුව ද, මේ වගන්තිය ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව වූ දිනයෙහි (1980 ජනවාරි මස 24 වන දිනයෙහි ) සාක්ෂි මෙහෙයවීම ආරම්භ කර තිබුණේ යම් නඩුවක ද ඒ නඩුව එකී මහාධිකරණය විසින් විභාග කර තීරණය කරනු ලැබිය යුතු ය.

## VII වන කොටස

## අර්ථ නිරූපනය

86. මෙම පනතේ කාර්යයන් සඳහා තැනැත්තකු විසින් හෝ තැනැත්තකුගේ නමින් වෙත යම් තැනැත්තකුගේ භාරයක් ලෙස හෝ වෙන යම් තැනැත්තකුගේ ප්‍රයෝජනය සඳහා තබා ගෙන තිබෙන දේපළ ඒ වෙනත් තැනැත්තා විසින් අනියම් වශයෙන් හිමිකර ගෙන තිබෙන දේපළ ලෙස සලකනු ලැබිය යුතු ය.

දේපළ වල අනියම් අයිතිය

87. මෙම පනතෙහි ආණ්ඩුව පිළිබඳ සෑම සඳහන් කිරීමක ම පළාත් පාලන ආයතනයක් පිළිබඳ සහ සෑම උප ලේඛණගත ආයතනයක් පිළිබඳ සඳහන් කිරීමක් ඇතුළත් ලෙස තේරුම් ගත යුතු ය.

ආණ්ඩුව පිළිබඳ සඳහන් කිරීම තේරුම් කර ගත යුතු ආකාරය.

88. මෙම පනතේ කාර්යයන් සඳහා, තැනැත්තෙක් හෝ ඔහුගේ දැනුම හෝ එකගත්වය ඇතිව ක්‍රියා කරන වෙන යම් තැනැත්තෙක් වෙනත් යම් තැනැත්තකුට හෝ වෙනත් යම් තැනැත්තකුගේ ප්‍රයෝජනය හෝ භාරය පිණිස නියම වශයෙන් හෝ අනියම් වශයෙන් යම් තුටු පඩුරක් දුනහොත්, සැපයුවහොත් හෝ පැවොත්, නැතහොත් දීමට, සැපයීමට හෝ පෑමට එකග වූවහොත්, බැඳුනහොත් හෝ පොරොන්දු වූවහොත්, ඔහු තුටු පඩුරක් පිරිනමයි.

තැනැත්තෙක් තුටු පඩුරක් පිරිනමන්නේ කවර විට ද යන බව.

89. මෙම පනතේ කාර්යයන් සඳහා-

(අ) තැනැත්තෙක් හෝ ඔහුගේ දැනුම හෝ එකගත්වය ඇතිව ක්‍රියා කරන වෙන යම් තැනැත්තෙක් පළමු සඳහන් තැනැත්තා හෝ වෙනත් යම් තැනැත්තකු සඳහා නියම වශයෙන් හෝ අනියම් වශයෙන් යම් තුටු පඩුරක් ඉල්ලා සිටියහොත්. නිමන්ත්‍රණය කළහොත්. ඉල්ලූවොත් හෝ ලැබීමට කැමැත්ත දැක්වූවහොත්. ඔහු තුටු පඩුරක් අයදින අතර

(ආ) යම් තැනැත්තෙක් හෝ ඔහුගේ දැනුම හෝ එකගත්වය ඇතිව ක්‍රියා කරන වෙන යම් තැනැත්තෙක් පළමු සඳහන් තැනැත්තා හෝ වෙනත් යම් තැනැත්තකු සඳහා නියම වශයෙන් හෝ අනියම් වශයෙන් යම් තුටු පඩුරක් ගතහොත්. ලැබුවහොත් හෝ ලබාගත හොත්. නැතහොත් ගැනීමට හෝ ලැබීමට හෝ ලබා ගැනීමට එකග වූවහොත්. ඔහු තුටු පඩුරක් භාර ගනියි.

තැනැත්තෙක් තුටු පඩුරක් අයදින්නේ හෝ භාර ගන්නේ කවර විට ද යන බව.

89 අ. යම් තුටු පඩුරක් අයැදීම හෝ භාරගැනීම මේ පනත යටතේ වරදක් වන විට ඒ තුටු පඩුර අයැදින හෝ භාර ගන්නා රජයේ සේවකයකු ඒ අයැදීම හෝ භාරගැනීම ශ්‍රී ලංකාවෙන් පිටත දී කරන ලද නම්, ඒ වරද ශ්‍රී ලංකාව තුළ දී කරන ලද සේ සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව, වෙනත් නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, ඒ වරද පිළිබඳව නඩු විභාග කිරීමට කොළඹ පැවැත්වෙන මහාධිකරණයට අධිකරණ බලය ඇත්තේ ය.

රජයේ සේවකයා විසින් ශ්‍රී ලංකාවෙ පිටත දී තුටු පඩු අයැදීම හෝ භාර ගැනීම.

(ජා.රා.1974 අංක 38 §

(1980 අංක 9§ 29)

යෙදුම් වල අර්ථය.

*90. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මෙම පනතෙහි -

"නියමිත දිනය" යන්නෙන් 1954 මාර්තු මස 1 වන දින අදහස් වේ.

"අල්ලස්" යන්නෙන්. මෙම පනතේ II වන කොටසේ යම් විධානයක් උල්ලංඝනය කරමින් යම් තුටු පඬුරක් පිරිනැමීම. අයැදීම හෝ භාර ගැනීම නැතහොත් එබඳු යම් විධිවිධානයක් උල්ලංඝනය කරමින් කරනු ලබන වෙන යම් ක්‍රියාවක් අදහස් වේ.

(1994 අංක 20 §16 (1)

"කොමිෂන් සභාව" යන්නෙන්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමට 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතින් පිහිටුවන ලද කොමිෂන් සභාව අදහස් වේ;

"අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන්නෙන්. 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත යටතේ පත් කරන ලද අල්ලස් සහ දූෂණ වැළැක්වීමේ අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ.

(1994 අංක 20 §16 (1)

"පරීක්ෂණ කොමිෂන් සභාව" යන්නෙන් මෙම පනත යටතේ පත් කරනු ලැබූ පරීක්ෂණ කොමිෂන් සභාවක් අදහස් කෙරේ.

"උපලේඛනගත ආයතනය" යන්නෙන් මේ පනතේ උපලේඛනයේ තත්කාලයෙහි නිශ්චිතව සඳහන් වන යම් මණ්ඩලයක්, ආයතනයක්. සංස්ථාවක් නැතහොත් වෙනත් මණ්ඩලයක් ද. මේ පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතන යක් විය යුතු යැයි යම් ප්‍රඥප්තියක විධිවිධාන යටතේ සලකනු ලබන යම් මණ්ඩලයක්. ආයතනයක්. සංස්ථාවක් නැතහොත් වෙනත් මණ්ඩලයක් ද අදහස් වන අතර -

(1990 අංක 9 § 30)

(අ) එකී යම් මණ්ඩලයක්, ආයතනයක්, සංස්ථාවක් නැතහොත් වෙනත් මණ්ඩලයක් විසින් , හෝ

(ආ) එකී මණ්ඩල , ආයතන, සංස්ථා නැතහොත් වෙනත් මණ්ඩල එකකට වැඩි ගණනක් විසින් සමස්තයක් වශයෙන්

කොටස්වලින් සියයට පනස් එකකට නොඅඩු ප්‍රමාණයක් දරනු ලබන්නාවූ පොදු හෝ පෞද්ගලික යම් සමාගමක් හෝ වෙනත් මණ්ඩලයක් ද එයට ඇතුළත් වේ.

"තුටු පඬුර" යන්නට -

(අ) මුදල් හෝ යම් තෑග්ගක්, ණයක්, ගාස්තුවක්,පාරිතෝෂිකයක්,කොමිස් මුදලක්, වටිනා ඇපයක්, නැතහොත් යම් වර්ගයකට අයත් චංචල හෝ නිශ්චල වෙනත් දේපලක් හෝ දේපළක සම්බන්ධතාවක්.

(ආ) යම් ධුරයක්. රක්ෂාවක් හෝ ගිවිසුමක්.

(ඇ) යම් ණයක, ගැතිකමක හෝ වෙනත් කවර හෝ බැඳීමක සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් වූ යම් ගෙවීමක්, මිදීමක්, නිදහස් කිරීමක් හෝ ඇවර කිරීමක්.

(ඈ) පමුණුවා ඇති හෝ පැමිණවිය හැකි යම් දණ්ඩනයකින් හෝ නොහැකියාවකින් නැතහොත් එවකටත් ආරම්භ කර තිබෙන විනයමය හෝ දණ්ඩනමය ස්වභාවයකින් යුතු නඩුවකින් හෝ නඩු කටයුත්තකින් ආරක්ෂාව ඇතුළු සහ යම් අයිතිවාසිකමක් හෝ යම් නිල බලයක් හෝ යුතුකමක් ක්‍රියාවෙහි යෙදවීම හෝ ක්‍රියාවෙහි යෙදවීමෙන් වැළකී සිටීම ඇතුළු, කවර වර්ගයකට හෝ අයත් වෙන යම් සේවයක් . උපකාරයක් හෝ වාසියක් සහ

(ඉ) ඉහතින් වූ (අ). (ආ). (ඇ). සහ (ඈ) ඡේදයන්හි අර්ථානුකූල වූ යම් තුටු පඩුරක් පිරිනැමීම. දීමට බැඳීම හෝ පොරොන්දු වීම ඇතුළත් වේ.

"පළාත් පාලන ආයතනය "යන්නට, යම් මහා නගර සභාවක්. නගර සභාවක්. සුළු නගර සභාවක් ගම් සභාවක්. සෞඛ්‍ය මණ්ඩලයක් හෝ සංවර්ධන මණ්ඩලයක් අදහස් වන අතර.

(අ) එබඳු යම් සභාවක කාරක සභාවක්. සහ

(ආ) නගර සභා ආඥාපනතේ 29 වන වගන්තිය යටතේ නගර සභාවක් විසින් හෝ සුළු නගර සභා ආඥාපනතේ 28 වන වගන්තිය යටතේ සුළු නගර සභාවක් විසින් පත් කරනු ලැබූ කාරක සභාවක් ද එයට ඇතුළත් වේ.

"රජයේ සේවකයා " යන්නට අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකු. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 45 වන ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද අමාත්‍යවරයකු. කථානායකවරයා, නියෝජ්‍ය කථානායකවරයා, කාරක සභා නියෝජ්‍ය සභාපතිවරයා. නියෝජ්‍ය අමාත්‍යවරයකු. පළාතක ආණ්ඩුකාරවරයකු. පළාතක අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍ය වරයක, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, රජයේ සෑම නිලධරයකු. සේවකයකු හෝ සේවා නියුක්තයකු හෝ පාරිශ්‍රමිකයක් ලැබුව ද නොලැබුව ද පළාත් සභාවක. පළාත් පාලන ආයතනයක හෝ උපලේඛනගත ආයතනයක හෝ කොටස්වලින් සියයට පණහකට වැඩි ප්‍රමාණයක් ආණ්ඩුව විසින් දරනු ලබන 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද සමාගමක යම් සභාපතිවරයකු, අධ්‍යක්‍ෂවරයකු, අධිපතිවරයකු, සමාජිකයකු. නිලධරයකු හෝ සේවා නියුක්තිකයකු, පළාතක රාජ්‍ය සේවයේ සාමාජිකයකු, සෑම ජූරි සභිකයකු, සෑම බලයලත් මිනින්දෝරුවරයකු සහ යම් අධිකරණයක් විසින් හෝ වෙනත් යම් රජයේ නිසි බලධරයකු විසින් යම් කටයුත්තක් හෝ කාරණයක් තීරණය කිරීම හෝ වාර්තා කිරීම පිණිස යොමු කර ඇති සෑම බේරුම්කරුවකු හෝ වෙනත් තැනැත්තකු ද ඇතුළත් වේ: (1994 අංක20§16(2)

එසේ වුව ද, යම් පළාත් පාලන ආයතනයක් විසුරුවා හැර ඇති හා ඒ ආයතනයේ කටයුතු පරිපාලනය කිරීම යම් තැනැත්තකු වෙත පැවරී ඇති අවස්ථාවක, ඒ ආයතනය විසුරුවා හැරීමට ඉහතින් ම සේවයෙහි නියුක්තව සිටියා වූ සහ එය විසුරුවා හැරීමෙන් පසුව තවදුරටත් සේවයෙහි නියුක්තව සිටින්නා වූ ඒ පළාත් පාලන ආයතනයේ සෑම සේවා නියුක්තිකයකු ම මේ පනතේ කාර්ය සඳහා රජයේ සේවකයකු ලෙස සලකනු ලැබිය යුතු ය.

---

1994 අංක 20 දරන අල්ලස් (සංශෝධන) පනතින් ප්‍රධාන ප්‍රඥප්තියේ 90 වන වගන්තියට කරන ලද සංශෝධනය:

(අ) එය. පළාතක ආණ්ඩුකාරවරයකුට, පළාතක අමාත්‍ය මන්ඩලයක අමාත්‍යවරයකුට හෝ පළාත් සභාවක මන්ත්‍රීවරයෙකුට, නිලධරයකුට හෝ සේවා නියුක්තයකුට හෝ පළාතක රාජ්‍ය සේවයේ සාමාජිකයකුට අදාළ වන තාක් දුරට, 1987 නොවැම්බර් මස 14 වන දින බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතුය.

(ආ) එය. වෙනත් යම් තැනැත්තකුට අදාළ වනතාක් දුරට, ප්‍රධාන ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම ආරම්භ වූ දින බලාත්මක වූ ලෙස. සියළු කාර්ය සඳහා සලකනු ලැබිය යුතුය.

## උප ලේඛනය

(84 සහ 90 වන වගන්ති)

1. ධාරීමාර්ග (සංශෝධන) පනත යටතේ පිහිටුවනු ලැබූ උපදේශක කාරක සභා.
2. ප්‍රසිද්ධ විභාග පනත යටතේ පිහිටුවනු ලැබූ උපදේශක කාරක සභා.
3. කෘෂි පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතන පනත යටතේ පිහිටුවනු ලැබූ කෘෂි පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය.
4. ගොවිජන සේවා පනත යටතේ සංස්ථාපිත ගොවිජන සේවා කාරක සභා.
5. කෘෂිකර්ම රක්ෂණ(ජාතික රාජ්‍ය සභාවේ) පනත යටතේ පිහිටුවනු ලැබූ කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලය.
6. ලංකා ගුවන් සේවා(සංස්ථාගත කිරීමේ) පනත් යටතේ පිහිටුවනු ලැබූ සීමාසහිත ලංකා ගුවන් සේවය.
7. පරමාණු බල ශක්ති අධිකාරිය පනත යටතේ පිහිටුවනු ලැබූ පරමාණු බල ශක්ති අධිකාරිය.
8. ආයුර්වේද පනත යටතේ පිහිටුවනු ලැබූ ආයුර්වේද වෛද්‍ය සභාව. ආයුර්වේද විද්‍යාලය හා ආරෝග්‍ය ශාලා මණ්ඩලය සහ ආයුර්වේද පර්යේෂණ කාරක සභාව.
9. ලංකා බැංකු ආඥාපනත යටතේ පිහිටුවනු ලැබූ ලංකා බැංකුව.
10. ප්‍රාග්ධන බදු පනත යටතේ සංස්ථාපිත විනිශ්චය අධිකාර මණ්ඩල .
11. රබර් පාලන ආඥාපනත යටතේ සංස්ථාපිත අභියාචනා මණ්ඩල
12. ආරක්ෂක ස්ථාන පනත යටතේ සංස්ථාපිත පාලන මණ්ඩල .
13. පොල් සංවර්ධන පනත යටතේ පිහිටුවනු ලැබූ මණ්ඩල .
14. ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ සංස්ථාපිත සමාලෝචන මණ්ඩලය.
15. ගෙවල් කුලී පනත යටතේ සංස්ථාපිත සමාලෝචන මණ්ඩල .
16. බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨය පනත යටතේ පිහිටුවනු ලැබූ බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨය.
17. ලංකා ප්‍රමිති කාර්යාංශ පනත යටතේ පිහිටුවනු ලැබූ ලංකා ප්‍රමිති කාර්යාංශය.
18. මුදල් නීති පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා මහ බැංකුව.
19. නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත යටතේ පිහිටුවනු ලැබූ ප්‍රධාන සැලසුම් කොමිෂන් සභාව.
20. ලංකා විදුලි බල මණ්ඩල පනත යටතේ පිහිටුවනු ලැබූ ලංකා විදුලි බල මණ්ඩලය.
21. ලංකා හෝටල් සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ලංකා හෝටල් සංස්ථාව.
22. ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතන පනත යටතේ සංස්ථාපිත ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතනය.
23. ලංකා ජාතික කාර්මික මණ්ඩල පනත යටතේ සංස්ථාපිත ලංකා ජාතික කාර්මික මණ්ඩලය.
24. ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩල පනත යටතේ පිහිටුවනු ලැබූ ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය.
25. ලංකා ඛණිජ තෙල් සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව.
26. ලංකා දුම්රිය ගාඩ්වරුන්ගේ හා රියදුරන්ගේ අන්‍යෝන්‍යාධාර සංගම් (සංස්ථාගත කිරීමේ) පනත යටතේ පිහිටුවනු ලැබූ ලංකා දුම්රිය ගාඩ්වරුන්ගේ හා රියදුරන්ගේ අන්‍යෝන්‍යාධාර සංගමය.
27. ලංකා තැව් සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ලංකා තැව් සංස්ථාව.
28. ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව.
29. ලංකා සංචාරක මණ්ඩල පනත යටතේ පිහිටුවනු ලැබූ ලංකා සංචාරක මණ්ඩලය.

30. පොල් කෙඳි පනත යටතේ පිහිටුවනු ලැබූ පොල් කෙඳි මණ්ඩලය.
31. කොළඹ දිස්ත්‍රික්කයේ (පහත් බිම් ප්‍රදේශ) ගොඩ කිරීමේ සහ
සංවර්ධනය කිරීමේ මණ්ඩල පනත යටතේ පිහිටුවනු ලැබූ
(පහත් බිම් ප්‍රදේශ) කොළඹ දිස්ත්‍රික්කයේ ගොඩ
කිරීමේ සහ සංවර්ධනය කිරීමේ මණ්ඩලය.
32. විශේෂ කොට්ඨාශ (කොළඹ) සංවර්ධන ආඥාපනත යටතේ පිහිටුවනු ලැබූ
කොළඹ විශේෂ කොට්ඨාශ සංවර්ධන මණ්ඩලය.
33. පුරාවස්තු ආඥාපනත යටතේ පිහිටුවනු ලැබූ වන්දි උපදේශක මණ්ඩලය.
34. ලංකා රජයේ උකස් සහ මුදල් (සංශෝධන) පනත යටතේ පිහිටුවනු ලැබූ
වන්දි විනිශ්චය අධිකාරිය
35. මහජන බැංකු (ස්ථාන අත්කර ගැනීමේ) පනත යටතේ පිහිටුවනු ලැබූ
වන්දි විනිශ්චය අධිකාරිය.
36. ණය මණ්ඩලයේ. ණය මණ්ඩල ආඥාපනත යටතේ
පත් කරනු ලැබූ කොමසාරිස්වරයෝ
37. වෙළෙඳ ව්‍යාපාර (අත්කර ගැනීමේ) පනත යටතේ පත් කරනු ලැබූ
නිසි බලධාරියා සහ ඒ පනත යටතේ පවරාගනු ලැබූ හෝ
අත්කරගනු ලැබූ වෙළෙඳ ව්‍යාපාර.
38. ආගම් සම්මේලන පනත යටතේ පිහිටුවනු ලැබූ ආගම් සම්මේලනය.
39. සමුපකාර සේවක කොමිෂන් සභා පනත යටතේ පිහිටුවනු ලැබූ
සමුපකාර සේවක කොමිෂන් සභාව.
40. සමුපකාර සමිති (ජාතික රාජ්‍ය සභාවේ) පනත යටතේ
ලියාපදිංචි කරනු ලැබූ සමුපකාර සමිති.
41. ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ සංස්ථා.
42. රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ සංස්ථා.
43. රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ සංස්ථා.
44. ණය සහනදායක ආඥාපනත යටතේ පිහිටුවනු ලැබූ
ණය සහනදායක මණ්ඩලය.
45. ලංකාවේ සංවර්ධන මුදල් සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ
ලංකාවේ සංවර්ධන මුදල් සංස්ථාව.
46. රජයේ අනුග්‍රහය ලබන සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ
රජයේ අනුග්‍රහ ලබන සංස්ථා.
47. කෘෂිකාර්මික නිෂ්පාදන (පැගීමේ හා කෙටීමේ සහතික මිල හා පාලන)
පනත යටතේ පිහිටුවනු ලැබූ සහතික මිල උපදේශක කාරක සභාව.
48. හෝමියෝපති පනත යටතේ පිහිටුවනු ලැබූ හෝමියෝපති සභාව.
49. කාර්මික සංවර්ධන පනත යටතේ පිහිටුවනු ලැබූ ලංකාවේ කාර්මික
උපදේශක සභාවේ කාර්මික මූල මණ්ඩල සහ
කාර්මික සංවර්ධන මණ්ඩලය.
50. කාර්මික නිෂ්පාදන පනත යටතේ පිහිටුවනු ලැබූ කාර්මික නිෂ්පාදන
විධිමත් කිරීමේ මණ්ඩලය.
51. ලංකාවේ වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතන පනත යටතේ
පිහිටුවනු ලැබූ ලංකාවේ වරලත් ගණකාධිකාරිවරයන්ගේ ආයතනය.
52. ලංකාවේ ඉංජිනේරුවරුන්ගේ ආයතන පනත යටතේ පිහිටුවනු ලැබූ
ලංකාවේ ඉංජිනේරුවරුන්ගේ ආයතනය.
53. බිම් මැනුම් හා සිතියම් සැලසුම් ආයතන පනත යටතේ පිහිටුවනු ලැබූ
බිම් මැනුම් හා සිතියම් සැලසුම් ආයතනය.
54. රක්ෂණ සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ලංකා රක්ෂණ සංස්ථාව.
55. කාර්මික ආරාවුල් පනත යටතේ පිහිටුවනු ලැබූ කම්කරු විනිශ්චය අධිකාර.
56. සීමාසහිත ලංකා සළු සල .
57. මහවැලි සංවර්ධන මණ්ඩල පනත යටතේ පිහිටුවනු ලැබූ
මහවැලි සංවර්ධන මණ්ඩලය.

58. කිරි මණ්ඩල පනත යටතේ පිහිටුවනු ලැබූ කිරි මණ්ඩලය.
59. මුස්ලිම් පල්ලි හා පුණ්‍යාධාර භාර පනත යටතේ පිහිටුවනු ලැබූ
මුස්ලිම් පල්ලි හා පුණ්‍යාධාර භාර මණ්ඩලය.

60. ජාතික ආධුනිකත්ව මණ්ඩල පනත යටතේ පිහිටුවනු ලැබූ
ජාතික ආධුනිකත්ව මණ්ඩලය.
61. ජාතික ලොතරැයි මණ්ඩල පනත යටතේ පිහිටුවනු ලැබූ
ජාතික ලොතරැයි මණ්ඩලය.
62. ජාතික සැලසුම් සභා පනත යටතේ සංස්ථාපනය කරනු ලැබූ
ජාතික සැලසුම් සභාව.
63. ජාතික ඉතිරි කිරීමේ බැංකු පනත යටතේ පිහිටුවනු ලැබූ
ජාතික ඉතිරි කිරීමේ බැංකු.
64. ශ්‍රී ලංකා ජාතික විද්‍යා සභා (ජාතික රාජ්‍ය සභාවේ) පනත යටතේ
පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා ජාතික විද්‍යා සභාව.
65. වෙලෙඳ නැව් පනත යටතේ සංස්ථාපිත ජාතික ගුභ සාධක මණ්ඩලය.
66. ජාතික තරුණ සේවා පනත යටතේ පිහිටුවනු ලැබූ
ජාතික තරුණ සේවා සභාව.
67. තිත්දගම් ඉඩම් පනත යටතේ පිහිටුවනු ලැබූ තිත්දගම් ඉඩම් මණ්ඩලය
68. වී අලෙවි මණ්ඩල පනත යටතේ පිහිටුවනු ලැබූ වී අලෙවි මණ්ඩලය.
69. ලියාපදිංචි කළ ප්‍රජා මධ්‍යස්ථාන.
70. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත යටතේ පිහිටුවනු ලැබූ
පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ විනිශ්චය අධිකාරිය
71. ලියාපදිංචි කළ ග්‍රාම සංවර්ධන සමිති.
72. සාප්පු හා කාර්යාලීය සේවක (සේවය හා වේතන විධිමත් කිරීමේ )
පනත යටතේ සංස්ථාපිත වේතන විනිශ්චය අධිකාර.
73. ගෙවල් කුලී පනත යටතේ සංස්ථාපිත ගෙවල් කුලී මණ්ඩල .
74. සංචාරක සංවර්ධන පනත යටතේ පිහිටුවනු ලැබූ නානායම.
ජාතික තිවාඩු තිකේතන. තිකේතන බලධරයෝ.
75. ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩල පනත යටතේ පිහිටුවනු ලැබූ
ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලය.
76. රබර් පාලන පනත යටතේ පිහිටුවනු ලැබූ රබර් උපදේශක මණ්ඩලය.
77. නැව් නියෝජිතයන්ට බලපත්‍ර නිකුත් කිරීමේ පනත යටතේ
බලපත්‍ර නිකුත් කරනු ලැබූ නැව් නියෝජිතයෝ.
78. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා (සංශෝධන) (ජාතික රාජ්‍ය සභාවේ)
පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව.
79. ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනත යටතේ පිහිටුවනු ලැබූ
ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම.
80. ගමනාගමන මණ්ඩල (ජාතික රාජ්‍ය සභාවේ) පනත යටතේ පිහිටුවනු ලැබූ
ශ්‍රී ලංකා මධ්‍යම ගමනා ගමන මණ්ඩලය හා
ප්‍රාදේශීය ගමනා ගමන මණ්ඩල .
81. ශ්‍රී ලංකා සාහිත්‍ය මණ්ඩල පනත යටතේ පිහිටුවනු ලැබූ
ශ්‍රී ලංකා සාහිත්‍ය මණ්ඩලය.
82. ශ්‍රී ලංකා තේ මණ්ඩල (ජාතික රාජ්‍ය සභාවේ) පනත යටතේ පිහිටුවනු ලැබූ
ශ්‍රී ලංකා තේ මණ්ඩලය.
83. රාජ්‍ය චිත්‍රපට සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ
රාජ්‍ය චිත්‍රපට සංස්ථාව.
84. රාජ්‍ය මැණික් සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ
රාජ්‍ය මැණික් සංස්ථාව.
85. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු (ජාතික රාජ්‍ය සභාවේ) පනත
යටතේ පිහිටුවනු ලැබූ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව.